බන්ධනාගාර දෙපාර්තමේන්තුව
சிறைச்சாலைகள் திணைக்களம்
Department of prisons

ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව
கடன் நிவாரண சபை திணைக்களம்
Department of Debt Conciliation

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
சமுதாயஞ்சார் சீர்திருத்த திணைக்களம்
Department of Community Based Corrections



පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - අංක 95

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் – இல. 95

Series of Parliamentary Publication - No. 95

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports Tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4)

පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියෙහි වර්තමාන කාර්යසාධනය

පිළිබඳ විස්තර කැඳවීම - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 95 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව

<table>
<tr><th rowspan="2">අනු අංකය</th><th rowspan="2">සාකච්ඡා කරන ලද කරුණු</th><th rowspan="2">ගිණුම් කාරක සභාවේ නිර්දේශ / නියෝග</th><th colspan="3">මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග</th></tr>
<tr><th colspan="2">වර්තමාන තත්ත්වය</th><th>ඉදිරි සැලසුම්</th></tr>
<tr><td>01</td><td>නව පනත සකස් කිරීම</td><td>ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමෙන් අනතුරුව, නව බන්ධනාගාර පනත සකස්කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා වූ දින වකවානු (Time Frame) ඇතුලත් වාර්තාවක් 2023 ජූලි මස 10 වන දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි /ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නියෝග කළේය.
ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක: MOJ/AC/37/11/2023 හා 2023.07.10 දිනැති ලිපිය මඟින් ආදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.</td><td colspan="2">නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද බන්ධනාගාර පරිපාලක පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි. නීතිපති දෙපාර්තමේන්තුව විසින් එම කෙටුම්පතට අදාලව ලබා දුන් නිර්දේශ අධ්‍යනය කිරීමෙන් පසු වැඩිදුරටත් අවශ්‍ය නිර්දේශ/ පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත අදාල පනත් කෙටුම්පත හා නිර්දේශ යොමු කර ඇත. එම වාර්තාව ලැබීමෙන් පසු නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර අදාල නිර්දේශ ඇතුලත් අවසන් කෙටුම්පත ලබා ගැනීමට නියමිතය.</td><td>නව පනත් කෙටුම්පත සම්බන්ධ නිරීක්ෂණ පිළිබඳව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා මෙම අමාත්‍යාංශය අතර සාකච්ඡාවක් සිදු කිරීමට නියමිතය.</td></tr>
<tr><td>02</td><td>විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම</td><td>විගණන පනත අනුව විගණන විමසුමක් සම්බන්ධයෙන් දින 21ක් තුළ පිළිතුරු සැපයිය යුතු වුවත්, ඇතැම් විගණන විමසුම් සම්බන්ධව පිළිතුරු ලබා දීමට මාස තුනකට අධික කාලයක් ගත වී ඇති බව නිරීක්ෂණය වීම.</td><td colspan="2">ඒ අනුව 2024 වර්ෂයට ලද විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කිරීම පහත පරිදි වේ.
<table><tr><th>කාරණය</th><th>විගණන විමසුම් සංඛ්‍යාව</th></tr><tr><td>2024.01.01 දිනට පිළිතුරු සැපයීමට නියමිත විගණන විමසුම් සංඛ්‍යාව</td><td>11</td></tr><tr><td>2024 වර්ෂය තුල ලැබී ඇති විගණන විමසුම් සංඛ්‍යාව</td><td>15</td></tr><tr><td>2024.07.31 දිනට පිළිතුරු සපයා ඇති විගණන විමසුම් සංඛ්‍යාව</td><td>20</td></tr><tr><td>2024 වර්ෂයේ පිළිතුරු සැපයීමට ඇති විගණන විමසුම් සංඛ්‍යාව</td><td>06</td></tr></table>ඉහත පිළිතුරු සැපයීමට පවතින විගණන විමසුම් 06 අතුරින් විගණන විමසුම් 02ක් සඳහා පිළිතුරු මේ වන විට කෙටුම්පත් කර ඇති අතර ඉතිරි විගණන විමසුම් 04 සඳහා තොරතුරු කැඳවා ඇත.</td><td></td></tr>
</table>

03	කාර්ය මණ්ඩල පුරප්පාඩු	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව පවතින පුරප්පාඩු සම්පූර්ණ කරගන්නා ලෙසත්, දැනට අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන්නේ නම් අත්‍යවශ්‍යය තනතුරු සඳහා කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍ර.ග.නි. ට උපදෙස් ලබා දෙන ලදි.	2023.08.31 දිනටපසුවපහතපරිදිබන්ධනාගාරදෙපාර්තමේන්තුවේපැවැතිපුරප්පාඩුසම්පූර්ණකිරීමටකටයුතුකරඇත. 1. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : 75/10/3970 හා 2024.02.14 දිනැති ලිපිය මගින් බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I තනතුරේ පුරප්පාඩුව 2024.02.22 දින සිට සම්පූර්ණ කර ඇත. 2. රාජ්‍ය සේවා කොමිෂන්සභා ලේකම්ගේ අංක : PSC/APP/07/1286/2018 හා 2024.07.12 දිනැති ලිපියෙන් බන්ධනාගාර කොමසාරිස් තනතුරුසඳහා නිලධාරීන් 04දෙනෙකු උසස් කර ඇත. 3. රාජ්‍ය සේවා කොමිෂන්සභා ලේකම්ගේ අංක : PSC/PRO/07/1945/2023 හා 2024.02.16 දිනැති ලිපියෙන් විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී තනතුර සඳහා නිලධාරීන් 06දෙනෙකු උසස් කර ඇත. 4. රාජ්‍ය සේවා කොමිෂන්සභා ලේකම්ගේ අංක : PSC/APP/07/2020/2023 හා 2024.08.09 දිනැති ලිපියෙන් බන්ධනාගාර අධිකාරී තනතුර සඳහා නිලධාරීන් 05දෙනෙකු උසස් කර ඇත. 5. රාජ්‍ය සේවා කොමිෂන්සභා ලේකම්ගේ අංක : PSC/APP/8/5/106/2019 හා 2024.02.02 දිනැති ලිපියෙන් සහකාර බන්ධනාගාර අධිකාරී තනතුර සඳහා නිලධාරීන් 16දෙනෙකු උසස් කර ඇත. 6. රාජ්‍ය සේවා කොමිෂන්සභා ලේකම්ගේ අංක : PSC/APP/8/5/78/2021 හා 2024.06.21 දිනැති ලිපියෙන් සහකාර බන්ධනාගාර අධිකාරී තනතුර (පුනරුත්ථාපන) සඳහා නිලධාරීන් 02 දෙනෙකු උසස් කර ඇත. 7. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක: ඩී2/ප්‍ර.ඡේ./පත්වීම් 2023.12.05 දිනැති ලිපියෙන් ප්‍රධාන ජේලර් තනතුරු 19 ක් සම්පූර්ණ කර ඇත. 8. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක:ඩී14/ප්‍ර.සු.නි.(V) හා 2024.03.13 දිනැති ලිපිය මගින් ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී පිරිමි තනතුරු 02ක් සහ කාන්තා තනතුරු 01ක් සඳහා උසස්කර ඇත. 9. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක: ඩී2/ජේලර් පත්වීම්/1 (7) හා 2024.08.06 දිනැති ලිපියෙන් I පෙළ ජේලර් පිරිමි 30/ කාන්තා 01 ක් සඳහා උසස් වීම් ලබා දී ඇත. 10. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක: ඩී14/1 පෙළ පුනී තනතුරට උසස් කිරීම් හා 2024.03.13 දිනැති ලිපිය මගින්1 පෙළ පුනරුත්ථාපන (පිරිමි) 04ක් (කාන්තා) 01ක් සඳහා උසස්වීම් ලබා දී ඇත. 11. ඊට අමතරව පහත පත්කිරීම් සිදු කර ඇත. • II පෙළ ජේලර් පිරිමි 14 - කාන්තා 01 • සැරයන් පිරිමි 30 - කාන්තා 02 • කාර්යාල කාර්ය සහයක - 07 • කම්කරු - 07 • මුරකරු - 08 • මෝටර් රියදුරු - 06 • ට්‍රැක්ටර් රියදුරු -01 • ත්‍රීවිල් රියදුරු - 01 12. බන්ධනාගාර නියාමක තනතුර - පුරප්පාඩු පිරවීම (i)මගේ අංක :MOJ/E008/RECR.CRU/PROCESS හා 2023.01.04 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී	1.බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක: ඩී1/70/2001 හා 2023.12.15 දිනැති ලිපිය අනුව මගේ අංක: Moj/PrisonAd/Ad06/ කොමසාරිස් / ශ්‍රී ලංකා ප.සේ. හා 2024.01.02 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ස.කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් යොමු කර ඇත. එම ලිපියට පිළිතුරක් නොලද බැවින් 2024.08.27 දින ඒ සඳහා නැවත ලිපියක් යොමු කර ඇත. 2. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නවක නිලධාරීන් බඳවා ගන්නා විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත අනුමත කර ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ තනතුරක් වන සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම) තනතුර සඳහා නිලධාරියෙකු ලබා දීමට කටයුතු කරන බව කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් 2024.01.04 දිනැතිව දන්වා ඇත. 3.මගේ අංක : PSC/APP/11/8/1/2024 හා 2024.06.18 දිනැති ලිපියේ අනුමැතිය පරිදි අයදුම්පත් කැඳවා ඇත. 4. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උප වැඩපරීක්ෂක තනතුරු 05ක් සහ වැඩ පරීක්ෂක තනතුරු 05ක් සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නිර්දේශ සහිත වාර්තාවක් සකස් කර ඇත. 5. බන්ධනාගාර නියාමක බඳවා ගැනීම් කටයුතු සම්බන්ධ ඉදිරි සැලැස්ම - ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වීම. -ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල සකස් කිරීම. - යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම. - යෝග්‍යතා ඇගයීම් පරීක්ෂණයේ ප්‍රතිඵලවිභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. - විභාග කොමසාරිස් ජනරාල්ගේ අවසන් ප්‍රතිඵල ලේඛනය අනුව නියාමක තනතුරට බඳවාගැනීම. - බන්ධනාගාර ආඥනීකනියාමක පුහුණුවට කැඳවීම. - බන්ධනාගාර ආයතන වෙත අනුයුක්ත කිරීම. 6. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය වෙත නිලධාරීන් බඳවා

07	බන්ධනාගාර තදබදය අවම කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර	දඩ ගෙවා ගැනීමට නොහැකිවීම නිසා දිවයිනේ බන්ධනාගාරවල රඳවා ගෙන සිටින සිරකරුවන් ඔවුන් ගෙවිය යුතු දඩ ප්‍රමාණයන් අනුව වෙන් වශයෙන් **(Breakdown)** දක්වමින් සකස් කරන ලද වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසද, ජනාධිපති සමාව යටතේ නිදහස් කරනු ලබන සිරකරුවන් ප්‍රජා විශෝධනයට යොමු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කර ගැනීමට කටයුතු කරන ලෙසද, ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදි.	**2024.08.20 දිනට දඩ ගෙවා ගත නොහැකිව සිටින රැඳවියන්ගේ සංඛ්‍යාත්මක තොරතුරු ඇතුලත් වාර්තාව** 1. ජනාධිපති සමාව යටතේ නිදහස් කරනු ලබන සිරකරුවන් ප්‍රජා විශෝධනයට යොමු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කර ගැනීමට ප්‍රජා විශෝධන පනත සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කළ සංශෝධිත පනත් කෙටුම්පත නීතිපතිගේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

ආයතනයේනම	රු:5,000/= අඩු	රු:5,000-10,000/= අතර	රු:10,000-15,000/= අතර	රු: 15,000-20,000/= අතර	රු: 20,000/= ටවැඩි	එකතුව
වැලිකඩ	76	84	11	11	28	210
මහර	1	40	4	1	15	61
බෝගම්බර	1	8	15	4	2	30
අනුරාධපුර	2	20	6	4	9	41
මැගසින්	20	26	11	1	0	58
කොළඹ රිමාන්ඩ්	9	7	2	0	1	19
අගුණකොලපැලැස්ස	17	18	3	0	3	41
ත්‍රිකුණාමලය	4	5	6	1	5	21
කළුතර	1	4	6	6	3	20
කුරුවිට	3	97	63	13	7	183
බදුල්ල	1	6	7	0	0	14
ගාල්ල	12	11	22	0	12	57
මාතර	1	4	7	11	2	25
මිගමුව	6	9	3	2	17	37
කෑගල්ල	0	4	0	2	7	13
යාපනය	0	2	0	1	7	10
බූස්ස	4	7	0	2	9	22
මොණරාගල	6	10	1	0	5	22
පල්ලෙකැලේ	4	5	0	1	4	14
පොළොන්නරුව	24	9	1	3	8	45
වීරවිල	33	26	1	1	4	65
පල්ලන්සේන	237	297	33	1	18	586
තල්දෙන	58	68	13	2	10	151
වවුනියාව	5	4	0	1	4	14
අඹේපුස්ස	43	45	12	0	13	113
මඩකළපුව	1	12	0	3	4	20
වාරියපොල	37	23	28	39	12	139
වටරැක	29	32	17	3	8	89
කඳුරුගස්ආර	11	3	0	0	5	19
එකතුව	646	886	272	113	222	2139

			2. බන්ධනාගාර රැඳවියන් නිවාස අඩස්සියේ තැබීම පිළිබඳ කමිටු වාර්තාව පදනම් කරගනිමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද පනත් කෙටුම්පත අදාල කමිටුවේ සභාපති වන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු සහ ජනාධිපති නීතිඥ ගරු යසන්ත කෝදාගොඩ මහතාගේ අධීක්ෂණය සඳහා යොමු කර ඇත.	
08	රස පරීක්ෂක වාර්තා නොලැබීම හේතුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවීම	රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම නිසා සැකකරුවන්ට ඇප ලබා ගත නොහැකිව දීර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතව සිටීමට සිදුවී ඇති බව ප්‍රකාශ කළ කාරක සභාව, මෙය අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින්, සුදුසු පරිදි වැටුප්තල සකස්කොට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අදාළ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට ලබා ගැනීමට කටයුතු කරන ලෙස අධිකරණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත උපදෙස් ලබා දීම.	1. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක තනතුරුවලපැවති පුරප්පාඩු 09 ක් 2024.09.02 දින සම්පූර්ණ කර ඇත. ඊට අදාළ පත්වීම් ලිපි 2024.08.21 දිනැතිව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/SSD/11/RECRU -2024 යටතේ නිකුත් කර ඇත. 2. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරු 21 ක පවතින පුරප්පාඩු (ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක තනතුරු දහඅයක (16) සහ සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ සහකාර පරීක්ෂක තනතුරු පහක (05)) කඩිනමින් සම්පූර්ණ කිරීම සඳහා පොදු තරඟ විභාග ක්‍රමයෙන් බැහැරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල මත පදනම්ව බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අංක 2024/Cab Memo/J/ADM/101අමාත්‍ය මණ්ඩල සංදේශය 2024.09.10 දිනැතිව ඉදිරිපත් කර ඇත	
09	බන්ධනාගාරයෙන් නිදහස්වී යන සිරකරුවන් නැවත නැවතත් බන්ධනාගාර ගත වන බව තහවුරු කර ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රමයක් දෙපාර්තමේන්තුව සතුව නොමැතිවීම.	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය නිසි අයුරින් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින්, එම පද්ධතිය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන එකවර යෙදවීම අපහසුනම් කුලී පදනම මත ලබා ගැනීම වැනි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරක සභාව විසින් , ප්‍ර.ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි.	1. මේ වනවිට බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය සියලු බන්ධනාගාර තුල සක්‍රිය මට්ටමින් ක්‍රියාත්මක වේ.නමුත් මෙම පද්ධතිය මඟින් අපේක්ෂා කරන ප්‍රතිඵල ලබා ගැනීමට නම් පද්ධතිය තත්යකාලීන (Real Time)තොරතුරු ඉදිරිපත්කලයුතුය.එබැවින් එම කටයුතු සැප්තැම්බර් 01දින සිට ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී. 2. බන්ධනාගාරයෙන් නිදහස් වී යන සිරකරුවන් නැවත නැවතත් බන්ධනාගාර ගත වීමේදී ඔවුන් හඳුනා ගැනීම සඳහා වන ජීව මිතික පද්ධතිය(Bio-Metrics System) ස්ථාපනයට අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාවටනැංවීමහාඅවශ්‍යඋපාංගපිළිබඳවිශ්ලේෂණකටයුතුසිදුවෙමින්පවතී. 3. බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කර ඇති සේවාදායකය(Server)වෙනත් සේවා සැපයුම්කරුවකු(Service Provider) යටතේ ස්ථාපනයට අදාළ තොරතුරු විශ්ලේෂණ කටයුතු සිදු කරමින් පවතී. 4. පරිගණක ජාල නඩත්තු සඳහා අවශ්‍ය සහය ලබා ගැනීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීම හා අකර්මන්‍යව ඇති පරිගණක ජාල නඩත්තු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.	1. බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිගණක හා අවශ්‍ය උපාංග මිල දී ගැනීම හා එම පරිගණක ආයතන වෙත බෙදාහැරීම. 2. බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියේ සේවයේ යෙදෙන නිලධාරීන් සඳහා අවශ්‍ය වනපරිගණක පුහුණු වීම් කටයුතු සම්පාදනය කිරීම. 3. බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියට ජීව මිතික පද්ධතිය(Biometrics System) ස්ථාපනය කිරීම.
10	සිරකරුවන්ට ප්‍රමිතියෙන් තොර ආහාර සැපයීම	විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන පරීක්ෂා කිරීම්වලට අමතරව මෙවැනි කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීම අධිකරණ අමාත්‍යාංශයේ සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේද වගකීමක් බව කාරක සභාව අවධාරණය කළේය. ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව පෙන්වා දුන්නේය.	සිරකරුවන්ට ප්‍රමිතියෙන් ඉහළ ආහාර සැපයීම විධිමත් කිරීම සඳහා පහත යෝජනා ක්‍රියාත්මක කරමින් පවතී. 1. සැපයුම් කරුවන් විසින් රැගෙන එන අමු හා වියලි ආහාර ද්‍රව්‍ය සහ රැඳවියන්ට පිළියෙල කරනු ලබන ආහාර මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ නිරන්තර පරීක්ෂාවට භාජනය කිරීම. 2. මස් වර්ග හා තේ කොළ වැනි ආහාර ද්‍රව්‍ය සන්නාම් නාමයෙන්ම (Brand) යුතු ද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කිරීම. 3. ස්වාධීන මහජන නියෝජිතයන්ගෙන් සැදුම්ලත් සංවිධාන සඳහා (බන්ධනාගාර වික්ෂණ මණ්ඩලය, ප්‍රාදේශීය නිරීක්ෂණ මණ්ඩලය) ආහාර පරීක්ෂාකර යම් අඩුපාඩුවක් ඇත්නම් එම කරුණු පරිපාලනයට වාර්තා කිරීමට අවසර ලබාදීම. 4. මීට අමතරව කලාපීය වෙනත් රටවල බන්ධනාගාර පද්ධතීන් සිදු කරන අයුරින් බන්ධනාගාර රැඳවියන් සඳහා පිසූ ආහාර සැපයීම Out Source කර ලබාදීමට පවතින හැකියාවන් පිළිබඳ අධ්‍යනයක් සිදු කිරීමට අපේක්ෂිතය	

11	වෛද්‍ය මණ්ඩලයට කරනු ලබන ගෙවීම්	වෛද්‍යවරුන්ගේ පැමිණීම, පිටවීම සටහන් කිරීම හා ඒ පාදක කොට ගෙවනු ලබන ගෙවීම් සම්බන්ධව පරීක්ෂා කර, 2023 ජූලි මස 10 වැනි දිනට පෙර ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු, ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත කාරක සභාව නියෝග කළේය.	මගේ අංක :MOJ/AC/37/11/2023 හා 2023.07.10 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව කාරක සභාව වෙත යොමු කර ඇත.	
12	විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද "සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපන කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය" පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම.	ඉහත සඳහන් විශේෂ විගණන වාර්තාවේ ඇතුලත් නිර්දේශ සහ නිගමන පිළිබඳ අදහස් හා යෝජනා ද, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ද 2023 ඔක්තෝබර් මස 25 වැනි දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක: MOJ/AC/37/11-1/2023 හා 2023.10.25 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.	එම ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාත්මක තත්වයේ පැවති නිර්දේශයන්හි වර්තමාන ප්‍රගතිය හා ඉදිරි සැලසුම් මේ සමග ඇමුණුම -01 ලෙස ඉදිරිපත් කර ඇත.	
13	බන්ධනාගාර නිලධාරීන් දිරිගැන්වීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.		(i) 19/2014 වක්‍ර ලේඛය ප්‍රකාරව බන්ධනාගාර නිලධාරීන් සඳහා රු.2,750.00ක දීමනාවක් ලබා දුන් අතර, එම දීමනාව වැඩි කිරීම සම්බන්ධව 2024.05.30 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2024.06.20 දින ඉදිරිපත් කරන ලද, 24/1080/614/046 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මගේ අංක:MOJ/prisonAD/05/prHq/දීමනා හා 2024.06.24 දිනැති ලිපිය අනුව 2024.07.01 දින සිට වැඩි කරන ලද රු.10,250.00ක දීමනා බන්ධනාගාර නිලධාරීන් සඳහා ගෙවීමට කටයුතු කරන ලදි. (ii) බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා බන්ධනාගාර ආයතනයන්හි සේවය කරනු ලබනඒකාබද්ධ සේවයේ නිලධාරීන් ඇතුළු අනෙකුත් සේවාවන්හි නිලධාරීන් 297 කප්‍රමාණයක් සඳහා මෙම දීමනා වැඩිකිරීම සම්බන්ධව දක්වා නොතිබූ බැවින්, ඒ සම්බන්ධව 2024.07.22 දිනැතිවඅමාත්‍ය මණ්ඩල සංදේශයක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඊට අතිරේක ලේකම් (පාලන) විසින් දැන්වූ පරිදි බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) හා බන්ධනාගාර කොමසාරිස් (මුදල්) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(ජනරාල්) හා අයවැය අධ්‍යක්ෂ(ජනරාල්) සමඟ පැවති සාකච්ඡාවේ දී අදාළ අවශ්‍යතාව පිළිබඳ හා ඔවුන්ගේ සේවාව පිළිබඳව සිදුකරන ලද කරුණු පැහැදිලි කිරීමේදී වාචිකව අදාළ ඉල්ලීම සම්බන්ධව එකඟතාවය ලබාදෙන බව දැනුම් දී ඇති බැවින් ඒ පිළිබඳව දන්වාබන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක: එස්.ඩබ්.ඩී/02/නිල දීමනා/2024 හා 2024.08.22 දිනැති ලිපිය මා වෙත යොමු කරන ලදී.	

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2024.08.31 දිනට

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය		ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.1	වර්ෂ 140 ක් පමණ පැරණි 1877 අංක 16 දරණ බන්ධනාගාර අඳෝපනත වර්තමානයට, දේශීයව හා ජාත්‍යන්තර ප්‍රමිතින්ට ගැලපෙන පරිදි සශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කිරීම (යොමුව 8.1 ඡේදය)	ශ්‍රී ලංකා බන්ධනාගාර ආඥා පනතේ (54 අධිකාරය වූ) 94 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති (1920 මාර්තු මස 19 දිනැති අංක: 7093 දරණ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ රීති) තවදුරටත් 2022.07.12 දිනැති අංක :2288/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරනු ලැබිය. එලෙස මේ යටතේ රීති 80, 165, 166, 178, 190, 196, 200, 211, 222, 237-238 යන්න සංශෝධනය කිරීමට පසුගිය වසර තුළ කටයුතු කර ඇත. මෙම පනත සංශෝධනය සඳහා වන ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් කාලරාමුවක් සකස් කර රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත මගේ අංක : MOJ/AC/37/11/2023 හා 2023.07.10 දිනැති ලිපිය මගින් යොමු කර ඇත මීට අමතරව නව පනතට ඇතුලත් කල යුතු බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් යෝජිත කරුණු පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේදී සාකච්ඡා සිදු කර ඇත. එමෙන්ම කෙටුම්පත් කරන ලද නව පනත සම්බන්ධව ගරු. නීතිපතිතුමන්ගේ මෙම අමාත්‍යාංශයේ නීති අංශය වෙත යොමු කර ඇත. තවද අමාත්‍යාංශයේ නීති අංශය විසින් නව පනත් කෙටුම්පත සම්බන්ධ බන්ධනාගාර දෙපාර්තමේන්තු නිරීක්ෂණ ලබා දෙන ඉල්ලා මගේ අංක : MOJ/L(1)/370/2023 හා 22.08.2024 දිනැති ලිපිය මගින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත.		නව පනත් කෙටුම්පත සම්බන්ධ නිරීක්ෂණ පිළිබඳව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා මෙම අමාත්‍යාංශය අතර සාකච්ඡාවක් සිදු කිරීමට නියමිතය. බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් නව කෙටුම්පත සම්බන්ධ නිරීක්ෂණ වාර්තාව යොමු කිරීමෙන් පසු නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර අදාල නිර්දේශ ඇතුලත් අවසන් කෙටුම්පත ලබා ගැනීමට නියමිතය.
9.2	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව හා බන්ධනාගාර අඳෝපනතේ 54 ඡේදයට අදාලව 1956 වර්ෂයේ සිදුකරන ලද සශෝධනයන්හි 179 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව සිරකරුවෙකු සඳහා පැවතිය යුතු අවම ඉඩකඩ හා පහසුකම් සහිත සිරිමැදිරි වාට්ටු හා ගොඩනැගිලි ඉදිකිරීමට කඩිනම් පියවරගත යුතු අතර, එමගින් සිරකරුවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම. (යොමුව 8.2 ඡේදය)	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතින අනුමත රැඳවි ධාරිතාව 2023 වසරේ දී 10,395 විය. එහෙත් 2024.08.30 දින අළුයම විවෘතයට අනුව සමස්ථ රැඳවියන් ප්‍රමාණය 29,094 කි. ඒ අනුව සමස්ථයක් ලෙස ගත්කල බන්ධනාගාර ආයතන තුල 279.8%ක තදබදයක් පවතින අතර මෙම ප්‍රමාණය බන්ධනාගාර ආයතනයෙන් ආයතනයට වෙනස් මට්ටමේ පවති.	I. ඒ අනුව බන්ධනාගාර ආයතන වල භූමියේ පවතින ඉඩ ප්‍රමාණය පිළිබඳවද සැලිකිල්ලට භාජනය කරමින් පසුගිය වසර කිහිපය තුල අය වැය මගින් වෙන්වූ ප්‍රතිපාදන භාවිතයෙන් බුස්ස බන්ධනාගාරයේ සිර කුටි 107ක් ඉදිකිරීමටත් , පෙර සවි සිර වාට්ටු 07ක් වාරියපොළ, මහර, කළුතර, නව මැගසින් බන්ධනාගාර තුළ ඉදිකිරීමටත් අවශ්‍ය කටයුතු කර ඇත. II. එමෙන්ම පල්ලන්සේන බන්ධනාගාරයේ නව දෙමහල් සිර ගොඩනැගිලි 04ක් (වාට්ටු 08) ක් ඉදිකිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර මල අපවහන පද්ධති ඉදිකිරීම පමණක් ඉදිකරමින් පවති. III. වීරවිල වැඩකඳවුර මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ නේවාසකයින් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය තුළද අබලන්ව පැවති වාට්ටු නැවත ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කර ඇත. IV. මීට අමතරව කොළඹ බන්ධනාගාර සංකීර්ණයේ පවතින අධික තදබදයට විසඳුමක් ලෙස එම බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලැවට පුනස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකර ඇත.	කළුතර බන්ධනාගාරයේ අබලන් ගොඩනැගිලි නවීකරණය කිරීම පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හා අදාළ අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති සාකච්ඡාවේදී තීරණය කරන ලද පරිදි මෙම ගෙඩනැගිලි කොටස් ලෙස ඉවත් කර නැවත ඉදිකිරීමට වන යෝජනාව 2025 අයවැය අස්තමේන්තුව සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට ඉදිරිපත් කරන ලදි. II. වැලිකඩ වැපල් අංශය හා D වාට්ටු සංකීර්ණය අළුවැඩියා කල යුතු ආකාරය සම්බන්ධ උපදෙස් හා සැලසුම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිය වාර්තා අංක : NBRO/PMD/CR-80 A/2016/2017, මගින් ලබා දී ඇත. ඒ අනුව ඊට අදාළ අළුත්වැඩියාවන් සිදුකිරීමට අවශ්‍ය ප්‍රමාණ පත්‍ර සකසා ඇති අතර ඒ සඳහා විශාල මුදලක් වෙන් කල යුතුව ඇත. අදාළ භූමිය විතැන් කිරීමට යෝජිත බැවින් මේ සම්බන්ධවද අවධානය යොමු කර ප්‍රතිපාදන සලසා ගැනීමට යෝජනා කිරීමට නියමිතය. III. වාරියපොළ බන්ධනාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2025 අය වැය මගින් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ඉදිරි කටයුතු ආරම්භ කිරීම. පල්ලේකැලේ බන්ධනාගාරයේ ඉදිකිරීම් සිදු කිරීමට පවතින විශේෂ සෑයේ සිරකරුවන් සඳහා වන වාට්ටු හා තරුණ වරදකරුවන්ගේ සිර වාට්ටු ඇතුළු ගොඩනැගිලි හා අනෙකුත් සේවා කඩිනමින් ඉදිකිරීමට කටයුතු කිරීම සඳහා NOR කම්ටු අනුමැතිය ලබා ගත් අතර ඊට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතියද සමග ඉදිරි කටයුතු 2025-2027 කාල රාමුව තුල සිදු කිරීමට නියමිතය. තවද වටරැක බන්ධනාගාරයේ ආරක්ෂිත තාප්පය ඉදිකර එහි නේවාසික ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියද 2025 අය වැය ඇස්තමේන්තුව සඳහා යෝජනා කර ඉදිරිපත් කර ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය		ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
			මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර පැවති ආර්ථික අර්බුධය හමුවේ මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව නව ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් තාවකාලිකව අත් හිටුවා ඇත. මෙහිදී ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව සිරකරුවෙකු සඳහා පැවතිය යුතු අවම ඉඩකඩ හා පහසුකම් සැලසීමට හැකිවන පරිදි සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකිරීමේදී අවධානය යොමුකර ඇත.	IV. එමෙන්ම නව බන්ධනාගාර ඉදිකිරීමේදී (කොළඹ බන්ධ. සංකීර්ණ පුනස්ථාපන ව්‍යාපෘතියේදී) මේ පිළිබඳව අවධානය යොමු කරමින් අදාළ ප්‍රමිතීන් හා විධි විධාන වලට අනුකූල වන පරිදි රැඳවියන් රැඳවීමට හැකි ලෙස සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකර ඇත.
9.3	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බන්ධනාගාර අඥාපනතේ 54 ඡේදයට අදාලව 1956 වර්ෂයේ සිදු කරන ලද සශෝධනයන්හි 178 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව බන්ධනාගාරයේ ඉඩපහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වර්ගීකරණය කර වෙන වෙනම රැඳවීමට පියවර ගැනීම (යොමුව 8.3 ඡේදය)	1.රැඳවියන් වර්ගීකරණය ස්ත්‍රී හා පුරුෂ, සිර හා සැක, තරුණ වරදකරුවන් , දඩුවමේ ස්වභාවය අනුව මරණ දඩුවම්, ජීවිතාන්ත , මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ හා විශේෂ සෙසුයේ රැඳවියන් ලෙස රැඳවියන් වෙන්කර රඳවා තැබීම දැනට සිදු කෙරේ.		
9.4	වර්තමානය වන විට වසා දමන ලද ගම්පහ වතුපිටිවල පිහිටි තරුණ වරදකරුවන් යහස්ථාපනය කිරීමේ විශෝධන මධ්‍යස්ථානය වැනි මධ්‍යස්ථානයක් නැවත ආරම්භ කර තරුණ වරදකරුවන් වෙනම රඳවා තබා පුනරුත්ථාපනය කිරීමට කටයුතු කිරීම. (යොමුව 8.4 ඡේදය)	බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥාපනත මඟින් යොමු කරනු ලබන වයස 16-22 වන තරුණ වරදකරුවන් වසර 03ක කාලයක් සඳහා අධිකරණය මඟින් ලබා දෙන රැඳවීම් නියෝගයක් මත වටරැක පිහිටි තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ රඳවනු ලබයි. එය රජයේ පාසැලක්ද සහිතව පවත්වාගෙන යනු ලබයි.	1. මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟී නොමැත.	
9.5	අබලන්ව ඇති සිරමැදිරි, වාට්ටු හා ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කර යථා පරිදි පවත්වාගෙන යාමටත් බන්ධනාගාර විතැන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගෙන ඇති ඉදිකිරීම් වර්ථමානයට, දේශීයව හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයෙන් ප්‍රමිතගතව සිදුකිරීමටත්, නව ඉදිරිකිරීම් සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් අත්පත් කරගැනීම හා අදාල ඉදිරිකිරීම් ආරම්භ කිරීම කඩිනම් කිරීම මඟින් බන්ධනාගාර තදබදය අවම කරගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.(යොමුව 8.5.1.8.5.2 ඡේදය)	1 අබලන් වූ සිර මැදිරි හා වාට්ටු හා ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය අය වැය මඟින් වාර්ෂිකව වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය මත ප්‍රමුඛතාගත කර සිර ශ්‍රමය භාවිතා කර සිදු කරනු ලබයි. 2 එමෙන්ම අන්තර්ජාතික රතු කුරුස සංවිධානය වැනි ආයතන වලද අනුග්‍රාහකත්වය යටතේ අබලන් වූ සිර මැදිරි, වාට්ටු හා ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණයට කටයුතු සිදු කර ඇත.මේ යටතේ වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශයේ වාට්ටු වල වහල අළුත්වැඩියාවන් හා තීන්ත ආලේපන කටයුතු සිදුකර ඇත.	1 දැනට කොළඹ බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ පුනස්ථාපනය කිරීමට හඳුනාගෙන පවතින ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කඩිනම් කිරීම. 2 වාරියපොළ බන්ධනාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු සඳහා 2025 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ගැනීම. 3 පල්ලේකැලේ නව දුම්බර බන්ධ. ඉදිකිරීමට පවතින ඉතිරි සිර ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු සඳහා 2025 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ගැනීම 4 විතැන් කිරීමට හඳුනාගෙන පවතින මාතර, ත්‍රිකුණාමලය, මඩකලපුව, වවුනියාව, ගාල්ල වැනි බන්ධනාගාර ආයතන විතැන් කිරීමේ ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය මූලික කටයුතු සපුරා ගැනීම.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.6	මූලස්ථාන කාර්යාල ගොඩනැගිල්ලේනි ඉදිකිරීම් පිරිවැය අවම කරගැනිමටත්, මූලස්ථාන කාර්යාල පරිශ්‍රයෙහි තදබදය අවම කිරීමට කටයුතු කිරීම (යොමුව 8.5.4 ඡේදය)	1 මේ වනවිට අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිම කර බන්ධනාගාර මූලස්ථාන කාර්යාල පරිශ්‍රයේ පැවති තද බදය අවම කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. 2 බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය සහ ඉංජිනේරු අංශය එම නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇත.	-
9.7	අධිකරණය සමග සාකච්ඡා කර සිරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති අභියාචන කැඳවීම කඩිනම් කරගැනිම සහ අවසන් කරගැනිම සඳහා ක්‍රියාමාර්ග ගැනිම (යොමුව 8.6 ඡේදය)	1 අධිකරණ කටයුතු සඳහා බලපෑම් කිරීමට හැකියාවක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට නොමැති හෙයින් මේ පිළිබඳ පවතින අවශ්‍යතාව අමාත්‍යාංශය වෙත දැනුවත් කිරීමට කටයුතු සිදු කර ඇත. 2 අභියාචනා සම්බන්ධ කටයුතු කඩිනම් කිරීම සඳහා අභියාචනාධිකරණ විනිසුරුවරුන් ප්‍රමාණය 12 සිට 20 දක්වාත් අභියාචනා අධිකරණ ප්‍රමාණය 06 සිට10 දක්වාත් වැඩිකිරීමට අමාත්‍යාංශය විසින් මේ වන විට කටයුතු කර ඇත. 3 තාක්ෂණය භාවිතා කර අභියාචනා සම්බන්ධ නඩු කටයුතු මෙහෙවීමටද අවශ්‍ය කටයුතු සිදුකර ඇත.	1 බන්ධනාගාර දෙපාර්තමේන්තුවට මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැත.
9.8	බන්ධනාගාරය තුළ අධිකරණයක් ස්ථාපිත කිරීමට ක්‍රියාමර්ග ගැනීමෙන් හා Tele conference වැනි නවීන තාක්ෂණික ක්‍රමවේදයක් භාවිතා කිරීම තුලින් සිරකරුවන් අධිකරණය වෙත ගෙනයාමෙන් තොරව ඔවුන්ගේ නඩු සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 6-8 ඡේදය)	1 දැනට සියළුම බන්ධනාගාර ආයතනයන්හි වීඩියෝ තාක්ෂණය ඔස්සේ අධිකරණ කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. II. UNODC ආයතනය මඟින් දකුණු පළාතේ බන්ධනාගාර ආයතනයන් තුළ අංග සම්පූර්ණ Video Conference පහසුකම සහිත කාමර ඉදි කිරීමට කටයුතු සිදු කරමින් පවති.ගාල්ල, මාතර, අඟුණකොළපැලැස්ස යන බන්ධනාගාර ආයතන සඳහා අවශ්‍ය Laptop හා පරිගණක තිර සපයා ගැනීම .අදියර 1 ලෙස අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ ඊට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය.	1 වීඩියෝ තාක්ෂණය ඔස්සේ අධිකරණ කටයුතු සිදුකිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම.මේ සඳහා KOICA ව්‍යාපෘතිය යටතේ මූල්‍යනය කර ගැනීම සඳහා වන ව්‍යාපාතිය යෝජනාවක්ද ඉදිරිපත් කර ඇත. 2 බන්ධනාගාර ආයතන හා අධිකරණ වල යටිතල පහසුකම් විධිමත් ආකාරයෙන් ඇති කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීම අය වැය ඇස්තමේන්තුව 2025 සඳහාද යෝජනා ඉදිරිපත් කර ඇත.
9.9	වයස්ගත සිරකරුවන් වයසට යාම හා රෝගී තත්වයන් මත එක්තැන්වූ සිරකරුවන්, සුව කල නොහැකි හා නිදන්ගත රෝග හේතුවෙන් පිඩාවිදින සිරකරුවන් ඔවුන්ගේ භාරකරුවන් වෙත භාරදීමට ඇති හැකියාව පිළිබඳව සොයාබලා ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර ක්‍රියාමාර්ග ගැනීම තුළින් රජයේ වියදම් අවම කරගැනිමට උත්සහ කිරීම. (යොමුව 8.7 ඡේදය)	1 ගැටළු පවතින කෙටි කාලීන සිර දඩුවම් ලබන සිරකරුවන්ගේ දඩුවම් කාල සීමාව අඩු කිරීම හා විශේෂ සමාව ප්‍රදානය කිරීම සලකා බැලීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. මෙම කමිටුව මඟින්ද නිදන්ගත රෝග පවතින සිරකරුවන් පිළිබඳවද සැලකිල්ලට ගෙන සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. අමාත්‍යාංශ අනුමැතියට යොමු කර ඇති ගණන -124 ක් වන අතර ඒ අතුරින් සිරකරුවන් 32 කගේ රෝගී තත්වයන් ද සලකා ඇත. 2 සිරකරුවන් හුදෙක් වයස්ගත වීම , නිදන්ගත රෝග යන කරුණු පමණක් සැලකිල්ලට ගෙන නිදහස් කිරීමට නිර්දේශ කිරීම සිදුකල නොහැකි වීම. 3 රෝගී තත්වයෙන් පසුවන සිරකරුවන් නිදහස් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීමට බන්ධනාගාර රීති 80 යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත් කල වෛද්‍ය මණ්ඩලය වෙත බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇත. මේ වන විට වෛද්‍ය මණ්ඩලය වෙත සිරකරුවන් 05 දෙනෙකුගේ ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇතත් එය වෛද්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කර නොමැත.	1 ගරු. අධිකරණ අමාත්‍යතුමන්ගේ විසින් යොමු කරන ලද අංක : MOJ/L8/RGM/2021 හා 02.08.2023 දිනැති ලිපිය මඟින් අදාළ කමිටුව විසුරුවා ඇති බව දන්වා ඇති බැවින් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු නොවීම. 2 බලපත්‍ර මණ්ඩලය මඟින් සිරකරුවන් නිදහස්කිරීම සඳහා වන චක්‍රලේඛය සඳහා මෙවැනි වයස්ගත හා රෝගී තත්වයන් මත එක්තැන් වූ සිරකරුවන් නිදහස් කිරීමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යනයක් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.10	සිරකරුවන් අබණ්ඩ පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමුකිරීම සඳහා දිර්ඝකාලීන පුනරුත්ථාපන සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකිරීම සහ එමගින් නැවත නැවත බන්ධනාගාරගත වන සිරකරුවන් ප්‍රමාණයට හා සිර පැනයාම් ප්‍රමාණය අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම . (යොමුව 8.8.1 ඡේද)	1 බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්ම තුළ මෙම කාර්යයේ අවශ්‍යතාව හඳුනාගෙන ඒ සඳහා පත් කරන ලද කම්ටුව විසින් පුනරුත්ථාපන සැලැස්මක් හා එය ඇඟයීමේ ක්‍රමවේදයක් සකස් කර එය වර්තමානයේ ක්‍රියාවට නංවා ඇත.	
		2 සිරකරුවන්ට සමාව ලබා දීමේ කම්ටුවට ඉදිරිපත් කිරීමේදී මෙම සමාලෝචනය අදාළ කර ගැනීමට කටයුතු කර ඇත.	
9.11	වාර්ෂිකව සිරගතවන සිරකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 40 වඩා අඩු වයසේ පසුවන්නන් බැවින් ඔවුන් පුනරුත්ථාපනය සඳහා විශේෂ අවධානය යොමුකොට සැලසුම් සකස් කිරීම හා එම ශ්‍රම බලකාය රටේ සංවර්ධනය සඳහා දායක කරගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම. (යොමුව 8.8.2ඡේද)	1 2022 වසරේ බන්ධනාගාර සංඛ්‍යාලේඛණ අනුව බන්ධනාගාර ගත සිරකරුවන්ගෙන් 64% ක ප්‍රමාණයක් වයස අවුරුදු 40ට අඩු රැඳවියන් වේ. එමෙන්ම 2022 වර්ෂයේ දත්ත වලට අනුව බන්ධනාගාරගත රැඳවියන්ගෙන් 71.8%ක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා සිරගත වුවන්ද වේ. එබැවින් මෙවැනි වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා "අම දිවි රිද්ම " එක්ව බැඳී මතින් මිදෙමු වැඩ සටහන ක්‍රියාත්මක කිරීම බන්ධනාගාර ආයතන 09ක් තුළ ආරම්භ කර ඇත. මේ යටතේ රැඳවියන් හට උපදේශණය, වෛද්‍ය ප්‍රතිකාර, අධ්‍යාත්මික සංවර්ධනය, සතිමත් බව පුහුණුව, සර්ව ආගමික වැඩ සටහන්, කෘෂි ප්‍රතිකාර, අධ්‍යාපනික කටයුතු (විධිමත් හා නොවිධිමත්) වෘත්තීය මාර්ගෝපදේශණය,ජීවන කුසලතා,අවධානම් වලට මුහුණ දීම් , ක්‍රීඩා වැනි පුනරුත්ථාපන හා ප්‍රතිකාරමය වැඩ සටහන් සඳහා යොමු කරනු ලැබේ. වයස අවුරුදු 40 ට අඩු රැඳවියන් තල්දෙන, වීරවිල, පල්ලන්සේන බන්ධනාගාර ආයතන තුළ රඳවා ඇත.	
		2 එමෙන්ම රැඳවි ශ්‍රම බලකාය රටේ සංවර්ධනයට දායක කර ගැනීම උදෙසා සියළුම රැඳවියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමට කටයුතු කර ඇත. ඔවුන් හට ලබා දුන් වෘත්තිය නිපුණතාවය මගින් සමාජගත වී රැකියා අවස්ථාවක නිරත ව රටේ ශ්‍රම බලකායට දායක වීම සඳහා අවස්ථාව සැලෙසන අතර සිරකරුවන් නිදහස් වීමේදී වෘත්තීය ආධාර ලබා දීමේ වැඩ සටහන්ද ක්‍රියාත්මක වේ.	
		3 බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්ම තුළද හඳුනාගන්නා පරිදි සිර ශ්‍රමය රටේ ශ්‍රම බලකායට එලදායි ලෙස දායක කර ගැනීමේ කටයුතු බන්ධනාගාර ආඥා පනතේ රීතින් හි පවතින ප්‍රතිපාදන හා බන්ධනාගාර දෙපාර්තමේන්තු වක්‍රලේඛණ වලටද අදාළ වන පරිදි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති වල යෙදවීමට වර්තමානයේ කටයුතු කර ඇත. මෙමගින් ඔවුන් ලබා දෙන ශ්‍රමය තුළ ඔවුනට වැටුපක් හිමි වන අතරම සිය වැටුපෙන් රජයේ ආදායමට බැර වන ප්‍රමාණය මත රජය විසින් දෙනිකව සිය නඩත්තුවට වැය කරන පිරිවැයෙන් යම් ප්‍රතිශතයක් සිය ශ්‍රමය මගින් උපයා දිමක්ද සිදුකරයි.තවද සිය සුභසාධන කටයුතු සඳහාද යම් දායකත්වයක් මෙම ක්‍රමවේදය තුළ සිය ශ්‍රමය ඔස්සේම ලබා දිමට කටයුතු කරයි. මෙවැනි ව්‍යාපෘති කිහිපයක් දැනටමත් ක්‍රියාත්මක අතර එවැනි ව්‍යාපෘති සඳහා යෝජනාද මේ වන විට ඉදිරිපත් ව ඇත. මෙම වෘත්තීය නිපුණතාව මගින් ඔවුන් හට සමාජගතවීමේදී රැකියා අවස්ථාවක් මෙම ආයතනය තුළම සලසා ගැනීමට ඉඩ ප්‍රස්ථාව විවර වනු ඇත.	
		4 තවද රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සඳහා යෝජනා කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.	

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.12	බන්ධනාගාරගත වන්නන්ගේ බහුතරය 08 ශ්‍රේණිය දක්වා පමණක් සමත් සිරකරුවන් බැවින් ඔවුන්ගේ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රමවත් අධ්‍යාපන වැඩපිළිවෙලක් සැලසුම්කොට ක්‍රියාත්මක කිරීම (යොමුව 8.8.3 ඡේදය)	බන්ධනාගාර සංඛ්‍යාලේඛණ 2022ට අනුව සිරගත බන්ධනාගාර රැඳවියන්ගෙන් 64% ක් 08 ශ්‍රේණිය සමත් හෝ ඊට අඩු අධ්‍යාපන මට්ටමකින් යුක්තවූවෝ වෙති. එබැවින් ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සඳහා වැඩ සටහන් බන්ධනාගාර ආයතන මට්ටමින් ක්‍රියාත්මක වේ. මේ යටතේ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතරම නේවාසිකයින් අ.පොෂ. (ස.පෙළ.) හා (උ.පෙළ) විභාග සඳහා යොමු කිරීමට කටයුතු සිදු කර ඇත. මීට අමතරව ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා දහම් පාසැල් අධ්‍යාපනයටද අවස්ථා විවර කර දී ඇත. ඒ යටතේ දහම් පාසැල් ශ්‍රේණි විභාග, අවසාන හා ධර්මාචාර්ය විභාග සඳහා පෙනී සිටීමට රැඳවියන් යොමු කර ඇත. වර්තමානයේදී උසස් අධ්‍යාපනය සඳහා රැඳවියන් යොමු කිරීමටද අවශ්‍ය කටයුතු සලසා දීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.	1 අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන ඒකකයේ සම්පත් දායකත්වය යටතේ, නේවාසිකයින්ගේ සාක්ෂරතාවය ඉහළ නැන්වීම සඳහා සාක්ෂරතා පංති පැවැත්වීම විධිමත් කිරීම.
9.13	සිරකරුවන්ගේ ශ්‍රමදායකත්වයෙන් නිෂ්පාදනය කරනු ලබන කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදන අලවියෙන් උපයන ලාභයෙන් කොටසක් සිරකරුවන්ගේ සුභසාධනයට යෙදවීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇතිකර ගැනීමට කටයුතු කිරීම (යොමුව 8.8.5 ඡේදය)	1 කෘෂිකාර්මික හා කාර්මික අත්තිකාරම් ගිණුම යටතේ උපයනු ලබන ලාභය රජයේ ආදායමට බැර කිරීම සිදු කරනු ලබයි. මෙම ගිණුම හරහා රැඳවි වෘත්තීය නිපුණතාව ඉහල නැංවීම සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසී ඇත. මෙන්ම මෙමගින් අදාළ කර්මාන්ත වලට සහභාගීවන සිරකරුවන් සඳහා වන සිර වෙතන මෙම ගිණුම යටතේ ගෙවීම් කිරීම සිදුවනු ඇත. 2 රැඳවි සුභ සාධනය සඳහා අරමුදල් වෙන් කරනු ලබන්නේ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරණ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධන අරමුදල් පනත හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ 1979 අංක 54 දරණ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධන අරමුදල් (සංශෝධන) පනත යටතේ සලසා ඇති ප්‍රතිපාදන තුලය. 3 කෘෂිකාර්මික හා කාර්මික අත්තිකාරම් ගිණුම යටතේ උපයනු ලබන ලාභයෙන් රජයේ ආදායමට බැර කරනු ලබන අතර සිරකරුවන් සුභ සාධනයට අවශ්‍ය ප්‍රතිපාදන රජය මගින්ම සලසන බැවින් මෙලෙස මෙම අරමුදල වෙත ලාභයෙන් කොටසක් යෙදවීම අත්‍යාවශ්‍ය නොවේ.	1 සිරකරු සුභසාධනය සඳහා රජය මගින් ද ප්‍රතිපාදන වෙන් කරනු ලබන බැවින් රජයේ ආදායමට බැර වන කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදන අලවියෙන් උපයන ලාභයෙන් කොටසක් සිරකරුවන්ගේ සුභසාධනයට යෙදවීම අවශ්‍ය නොවන බව බන්ධනාගාර දෙපාර්තමේන්තු මතය වේ. ඒ අනුව මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකෙරේ.
9.14	අපරාධ ගණයෙහිලා නොසැලකෙන හා කෙටි කාල පරිච්ඡේදයකට බන්ධනාගාරගත කරනු ලබන සිරකරුවන් අනෙකුත් සිරකරුවන් සමග බන්ධනාගාරගත කිරීම වෙනුවට පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමුකිරීම පහසු වන පරිදි වෙනත් විශෝධන මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. (යොමුව 8.9 ඡේදය)	1 මෙවැනි අපරාධ ගණයෙහිලා නොසැලකෙන කෙටි කාල පරිච්ඡේදයක් සඳහා බන්ධනාගාරගත වූවන් (දඩ, වන්දි හෝ ඇප තැන්පත් කිරීමට නොහැකිව) ප්‍රජා පාදක විශෝධනය සඳහා අධිකරණය මගින් යොමු කිරීමට කටයුතු කරනු ලබයි. 2 මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යටතේ පවතින ආයතන වෙත අධිකරණය විසින් යොමු කරනු ලැබේ.	මේ සම්බන්ධව යෝජනා කර ඇති නිවාස අඩස්සි යෝජනා ක්‍රමය පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා ගරු. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමකුගේ සභාපතීත්වය යටතේ මෙම අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව ඒ පිළිබඳ අධ්‍යන සිදුකර කමිටු නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර ඊට අදාළ නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් (මූලික කෙටුම්පත) කර එය අමාත්‍යාංශයේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත.එමෙන්ම අදාළ electronic monitoring ක්‍රමවේදය හා හැකියාවන් පිළිබඳ ICTA, ශ්‍රී ලංකා පොලිසිය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා අනෙකුත් සේවා සපයන්නන් හා විශේෂඥයන් සමග සම්බන්ධීකරණය කර ඒ පිළිබඳ උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.15	බන්ධනාගාර පරිශ්‍රය තුළ භාවිතා කිරීම තහනම් කර ඇති ද්‍රව්‍ය හෝ වෙනත් උපකරණ බන්ධනාගාරවලට ගෙන ඒම වැලැක්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම හා නවීන උපකරණ භාවිතයටත්, ආයතන සෝදිසි කිරීම් වලදී ගිණුම් කටයුතුභාවය ආරක්ෂා කිරීමටත් කටයුතු කිරීමෙන් බන්ධනාගාරගත වන සෑම සිරකරුවෙකුටම බන්ධනාගාර තුළදී කිසිදු නීති විරෝධී ක්‍රියාවක් සිදුකිරීමට ඇති ඉඩකඩ ඇහිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. (යොමුව 8.10 ඡේදය)	1 මේ යටතේ බන්ධනාගාර තුළ සිට මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන දරුණු සෙසුයේ අපරාධකරුවන් එකිනෙකා හා සම්බන්ධ වීමට ඇති හැකියාව සීමාකරමින් බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය තුළ සිර කුටි 107 ක් තුළ රඳවා ආරක්ෂිත කැමරා පද්ධතියක් මගින් ආවේක්ෂණ කටයුතු පාලනය කිරීමටත් බන්ධනාගාරය තුළට ඇතුළුවන සියළුම නිලධාරීන් හා පාර්සල් පරීක්ෂාව සඳහා පොලිස් විශේෂ කාර්ය බලකායද යොදවා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ඇත.	1 2023.06.09 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී ලබා දෙන ලද උපදෙස් අනුව නවීන තාක්ෂණික ආරක්ෂක උපකරණ වල අවශ්‍යතාව හඳුනාගෙන ඒ සඳහා වන වැය අස්තමේන්තුවක් සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
		2 a)කොළඹ බන්ධ. සංකීර්ණය, අගුණකොළපැලැස්ස, බූස්ස, කළුතර,මීගමුව, මහර යන බන්ධනාගාර ආයතන සඳහා දුරකථන සංඥා බාධක සවිකර ඇත.	2 2025-2027මධ්‍යකාලීන අයවැය රාමුව මගින් නවීන තාක්ෂණික උපකරණ ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට යෝජනා සහිත ව්‍යාපෘති වාර්තාවක් මෙම අමාත්‍යාංශයට යොමු කර ඇති අතර 2025 අයවැය ඇස්තමේන්තුවටද ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.
		b) මේ වන විට කොළඹ බන්ධනාගාර සංකීර්ණය ආවරණය කරමින් වැලිකඩ, නව මැගසින්, කොළඹ රිමාණ්ඩ්, කාන්තා අංශය හා බන්ධනාගාර රෝහල විවිධ මට්ටම් යටතේ අධීක්ෂණය කල හැකි වන පරිදි ආරක්ෂිත කැමරා පද්ධතිය ස්ථාපනය කර අවසන් කර ඇත.	
		3 අගුණකොළපැලැස්ස, බූස්ස, කළුතර, මීගමුව,මහර යන බන්ධනාගාර ආයතන සඳහා ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපනය කර ඇත.	
		4 බන්ධනාගාර ආයතන වල පිටත ආරක්ෂාව තර කිරීම, බන්ධනාගාර තුළට ගමන් කරන නිලධාරීන් /අමුත්තන් සෝදිසිය, බන්ධනාගාර තුළට රැගෙන යන පාර්සල් හා අනෙකුත් ද්‍රව්‍ය පරීක්ෂාව, බන්ධනාගාර රැඳවියන් ආරක්ෂණය හා CCTV කැමරා පද්ධති හා දුරකථන සංඥා බාධක වල කටයුතු වල අධීක්ෂණය යන කටයුතු සඳහා පොලිස් විශේෂ කාර්ය බලකායේ සහාය බූස්ස, අගුණකොළපැලැස්ස හා කොළඹ බන්ධනාගාර සංකීර්ණ සඳහා යොදා ගැනීම.	
		5 බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය නමින් ඒකකයක් පිහිටුවා ඒ සඳහා නිලධාරීන් 194 දෙනකු බඳවාගෙන බන්ධනාගාර සේවය සඳහා පුහුණුවෙන් පසු අනුයුක්ත කිරීම.හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් පුහුණුවෙන් පසුව ආයතන වෙත මේ වන විට අනුයුක්ත කර ඇත. එබැවින් කොළඹ බන්ධනාගාර පරිශ්‍රයේ හා අගුණකොළපැලැස්ස පරිශ්‍රයන් වල පිටත රාජකාරි සිදු කල පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් වෙනුවට හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ මෙම නිලධාරීන් විසින් වර්තමානයේ එම රාජකාරි සිදු කරනු ලබයි.	
		6 බන්ධනාගාර තුළ හා පුද්ගලයින් තුළ සඟවා සිටින ඉලෙක්ට්‍රොනික් උපකරණ හඳුනාගැනීම සඳහා **Non linear Junction Detectors** හා **Hand held non linear Junction Detectors** යන උපකරණ ලබා ගෙන බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන්ගේ කටයුතු ශක්තිමත් කිරීම.	
		7 බන්ධනාගාර තුළ සිදු වන නොයකුත් නීති විරෝධී කැරළි හෝ උපවාස සඳහා සහභාගී වන රැඳවියන් හඳුනාගැනීම සඳහා හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය සඳහා **Day & Night camera** සහිත **Quodcopter** යක් ලබා දීම.	
		8 **UNODC** ආයතනය මගින්ද ආරක්ෂිත කැමරා, අත් රැදි ලෝහ අනාවරක (Hand Held Metal Detectors), රථවාහන පරීක්ෂා කිරීමේ දර්පණ (Convex Mirrors for searching Vehicles), ජංගම දුරකථන අනාවරක (Mobile phone detectors)වැනි අත්‍යාවශ්‍ය උපකරණ සම්පාදනය කිරීමට කටයුතු කර ඇත.	

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය		ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.16	බන්ධනාගාර තුලට ඇතුළු වන බන්ධනාගාර කාර්ය මණ්ඩල නිලධාරීන් ඇතුළු සියලු පිටස්තර පාර්ශවයන් තරාතිරම නොබලා අනිවාර්ය පරීක්ෂාවකට ලක්කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතු අතර මේ සඳහා බන්ධනාගාර නිලධාරීන් නොවන වෙනත් පළපුරුදු හා විශේෂ නිපුණතාවයක් ඇති ආරක්ෂක නිලධාරීන් යොදාගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයාබලා ක්‍රියාමාර්ග ගැනීම. (යොමුව 8.10.6 ඡේදය)	1	බන්ධනාගාර තුළට ගමන් කරන බන්ධනාගාර නිලධාරීන් /අමුත්තන් ඇතුළු සියළු පාර්ශවයන් පරීක්ෂාවට ලක්කිරීම සඳහා පසුගිය වර්ෂ වල පොලිස් විශේෂ කාර්ය බලකායේ සහාය බූස්ස, අහුණකොළපැලැස්ස හා කොළඹ බන්ධනාගාර සංකීර්ණ සඳහා යොදා ගැනීමට කටයුතු කරන ලදී. බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය තුළට ගමන් කරන බන්ධනාගාර නිලධාරීන් /අමුත්තන් ඇතුළු සියළු පාර්ශවයන් පරීක්ෂාවට ලක්කිරීම, CCTV , Jammer වැනි තාක්ෂණික උපකරණ වල කටයුතු අධීක්ෂණයට සඳහා තවදුරටත් පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් යොදවා ඇත.	1.බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඇත.
		2	බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය නමින් ඒකකයක් පිහිටුවා ඒ සඳහා නිලධාරීන් 194 දෙනකු බඳවාගෙන බන්ධනාගාර සේවය සඳහා පුහුණුවෙන් පසු අනුයුක්ත කිරීම. වර්තමානයේ බන්ධනාගාරය තුළට ගමන් කරන බන්ධනාගාර නිලධාරීන් /අමුත්තන් ඇතුළු සියළු පාර්ශවයන් පරීක්ෂාවට ලක්කිරීම, CCTV , Jammer වැනි තාක්ෂණික උපකරණ වල කටයුතු අධීක්ෂණයට අනුයුක්ත කර ඇත්තේ හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් වන අතර ඔවුන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත බඳවා ගනු ලැබුවේ ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ වසර 12ක සේවා කාලයක් නිම කර නිත්‍යානුකූලව සේවයෙන් ඉවත් වූ නිලධාරීන් පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව වේ. එම නිලධාරීන් දුම්බර,අහුණකොළපැලැස්ස, මැගසින්, කොළඹ රිමාණ්ඩ්, වැලිකඩ,කාන්තා අංශය, මහර යන බන්ධනගාර ආයතන වල පරීක්ෂා කිරීම් සඳහා යොමු කර ඇත.	
9.17	සාර්ථක පුනරුත්ථාපන ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් සිරකරුවන්ට ඇති පීඩනය අවම කර ඔවුන් තුළ බන්ධනාගාර ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය ඇති කිරීමෙන් නිලධාරීන් තුළ ධනාත්මක චින්තනයක් ගොඩනැගීමෙන් සිර පැනයාම් අවමකර ගැනීමත්, නැවත අත්ඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය පසුවිපරම් කිරීමෙන් නැවත අත්ඩංගුවට ගන්නා ප්‍රමාණය උපරිම කරගැනීමට කටයුතු කිරීම (යොමුව 8.11 ඡේදය)	1	බන්ධනාගාරගත රැඳවියන් පුනරුත්ථාපනය සඳහා නව වැඩ සටහන් (සති පාසැල, අම දිවි රිද්ම වැඩ සටහන, ආගමික වැඩ සටහන් , කලා හා රසවින්දනාත්මක වැඩ සටහන්, කියවීමට පුරුදු කිරීම, වෘත්තීය පුහුණු වැඩසටහන්, සිර සර ශිල්ප ප්‍රදර්ශණය, චිත්‍ර ප්‍රදර්ශන,බලදක්ෂ කඳවුරු,කාව්‍ය නිර්මාණ එළිදැක්වීම් වැනි) බොහොමයක් හඳුන්වාදීම.	1	බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඇත.
		2	එමෙන්ම නිලධාරීන් හට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන පුහුණුවට අමතරව ICRC, UNODC වැනි ආයතන හා ඒකාබද්ධව සිරකරුවන්ට සැලකීම සඳහා අවම රීතීන් (නෙල්සන් මැන්ඩලා රීති), ගතික ආරක්ෂාව (Dynamic Security), Contingencies Planning, Incident Management, නව තාක්ෂණය භාවිතය වැනි බන්ධනාගාර පරිපාලනයට අදාළ තාක්ෂණික පුහුණු වීම් ලබා දීමට කටයුතු කර ඇත.		
		3	හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය පිහිටුවීම, බුද්ධි තොරතුරු රැස් කිරීම අදාළ තොරතුරු විශලේෂණය මෙන්ම විශේෂ ආරක්ෂණ සඳහා මෙම නිලධාරීන් යෙදවීමටත් කටයුතු කර ඇත.		
		4	බන්ධනාගාර අධිකාරීන් සමග මාසිකව පවත්වන අධිකාරී සාකච්ඡාවේදී අවධානම් සහිත තත්වයන්, ආරක්ෂාව තර කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග වැනි අවධානය යොමු කල යුතු කරුණු සම්බන්ධව දැනුවත් කිරීම.		
9.18	මත්ද්‍රව්‍ය වලට වැරදිකරුවන්ව් බන්ධනාගාරගත වන්නන් අනෙකුත් සිරකරුවන් සමග සිරගත කිරීම වෙනුවට වෙනත් විශෝධන මධ්‍යස්ථානයක් වෙත යොමුකිරීම සඳහා අධිකරණය සමග එක්ව ක්‍රියා කිරීම . (යොමුව 8.12.2 ඡේදය)	1.2021 වර්ෂයේ බන්ධනාගාර සංඛ්‍යාලේඛණ වාර්තා වලට අනුව බන්ධනාගාරගත රැඳවියන්ගෙන් 74.1%ක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරද සඳහා සිරගත වුවන්ද වේ.එබැවින් මෙවැනි වරදකරුවන් අනෙක් වරදකරුවන්ගෙන් වෙන් කර රඳවා පුනරුත්ථාපනය කිරීම සඳහා “අම දිවි රිද්ම “ එක්ව බැඳී මතින් මිදෙමු වැඩ සටහන බන්ධනාගාර ආයතන 09ක් තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.“අම දිවි රිද්ම ” එක්ව බැඳී මතින් මිදෙමු වැඩ සටහන අඹේපුස්ස, තල්දෙන, වීරවිල, පල්ලන්සේන, පල්ලේකැලේ, අනුරාධපුර, කන්දෙවත්ත, දුම්බර හා මහර යන බන්ධනාගාර ආයතන වල මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබයි.	1	බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
		මේ යටතේ රැඳවියන් හට උපදේශණය, වෛද්‍ය ප්‍රතිකාර, අධ්‍යාත්මික සංවර්ධනය, සතිමත් බව පුහුණුව, සර්ව ආගමික වැඩ සටහන්, කෘෂි ප්‍රතිකාර, අධ්‍යාපනික කටයුතු (විධිමත් හා නොවිධිමත්) වෘත්තීය මාර්ගෝපදේශණය,ජීවන කුසලතා,අවධානම් වලට මුහුණ දීම් , ක්‍රීඩා වැනි පුනරුත්ථාපන හා ප්‍රතිකාරමය වැඩ සටහන් සඳහා යොමු කරනු ලැබේ. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යටතේ පවතින ආයතන වෙත අධිකරණය විසින් යොමු කරනු ලැබේ. 2.එමෙන්ම විෂ මත් ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වැලැක්වීම සඳහා වන කාර්ය සාධක බලකායක් ගරු.අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමන්, ගරු. මහජන ආරක්ෂක අමාත්‍යතුමන්ගේ මූලිකත්වයෙන් හා නාවුක හමුදාපතිතුමන්ගේ සහභාගීත්වයෙන් මීට අදාළ අධිකරණ අමාත්‍යාංශය, සෞඛ්‍ය , ආරක්ෂක, අධ්‍යාපන යන අමාත්‍යාංශ,නීතිපති හා පොලිස් ආදී වශයෙන් සියළුම පාර්ශවකරුවන්ගේ සාමාජිකත්වයෙන් ස්ථාපනය කර ඇත. එමගින් මත්ද්‍රව්‍ය භාවිතය කරන්නන් බන්ධනාගාරගත වීම හා ඒ ආශ්‍රිතව පැන නැඟී ඇති බන්ධනාගාර තදබදය පිළිබඳවද ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා සලකා බැලීමට නියමිතය.	
9.19	කන්තාවන් සමග බන්ධනාගාර වන දරුවන්ගේ වයස් සීමාව අවුරුදු 05 ට වඩා අඩු වයස් මට්ටමට ගෙන ඒමට නීතිමය සංශෝධනයක් සඳහා ක්‍රියාමාර්ග ගැනීම. (යොමුව 8.13 ඡේදය)	1 බන්ධනාගාර ආඥා පනතේ සංශෝධිත 165 (1)-(7) හා 166 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව වයස අවුරුදු 05ට අඩු දරුවන් ඇතුලත් කිරීමේදී දැනට කටයුතු සිදු කරනු ලබයි	1.බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඇත.
9.20	හදන්වාදී මෙ වන විට වසර 05 ක් පමණ ගතව ඇති බන්ධනාගාර තොරතුරු කළමණාකාර පද්ධතිය සියළු බන්ධනාගාර ආයතන තුළ ක්‍රියාත්මක කිරීම කඩිනම් කර අපේක්ෂිත ප්‍රතිඵල ලභාකර යුතුය. (යොමුව 8.14 ඡේදය)	මේ වන විට බන්ධනාගාර ආයතන සියල්ලම ජාල ගත කිරීම් අවසන් කර බන්ධනාගාර තොරතුරු කළමණාකරන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සකස් කර ඇත. මේ වන විට සියළුම බන්ධනාගාර ආයතන වල දෛනිකව සිර ලියාපදිංචිය, සිර මාරු, උසාවි ඉදිරිපත් කිරීම්, නිදහස්කිරීම් කටයුතු පමණක් මෙම පද්ධතිය හරහා සිදු කරනු ලබයි.	මෙම වසර තුළ මෙම වැය විෂය සඳහා වෙන්වූ රු.මි.50.0ක ප්‍රතිපාදන සීමාව තුළ බන්ධනාගාර තොරතුරු කළමාණාකරණ පද්ධතිය බන්ධනාගාර ආයතන වල ක්‍රියාත්මක කිරීමට අත්‍යාවශ්‍ය පරිසණක 400ක් පමණ වූ ප්‍රමාණයෙන් 68ක පමණ ප්‍රමාණයක් 2024 වසරේ සපයා ගැනීමට ඇණවුම ප්‍රදානය කර ඇත. අයවැය මඟින් ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය මත මෙම සම්පූර්ණ පරිසණක අවශ්‍යතාව කඩිනමින් සලසා ගැනීමට නොහැකි වී ඇති බැවින් වෙනත් විදේශීය ප්‍රදාන (JURE/ UNODC/KOICA) හරහා මෙම අවශ්‍යතාව සපුරා ගැනීමටද ඉල්ලීම් මේ වන විටත් යොමු කර ඇත. එමෙන්ම මෙම පද්ධතිය හා සම්බන්ධ කල යුතුව පවතින ජීව මිතික දත්ත පද්ධතිය සම්බන්ධ කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරමින් පවතින අතර 2025 දී අදාළ අවශ්‍යතාව සපුරා ගැනීමට සැලසුම් කර ඇත.
9.21	සිරවාට්ටු හා සිරමැදිරි තුළ පිරිසිදු ප්‍රියමනාප පරිසරයක් ඇති කිරීමටත්, ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු පිළබඳව වැඩි අවධානයක් යොමු කිරීමටත්, මීයන්, මකුණන් වැනි සතුන්ගෙන් ඇතිවන පීඩා අවම කිරීමටත්, කටයුතු කිරීමෙන් සිරකරුවන්ට වැළදිය හැකි රෝග වලක්වා ගැනීම තුළින්, රජයේ වියදම් අවම කරගැනීමට කටයුතු කිරීම (යොමුව 8.15.1 ඡේදය)	සිර වාට්ටු හා සිර මැදිරි තුළ පිරිසිදු ප්‍රිය මනාප පරිසරයක් ඇති කිරීම හා ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම වෙනුවෙන් වන ප්‍රතිපාදන 2022 හා 2023 වසර සඳහා වෙන්කර ඇත. මෙමඟින් බන්ධනාගාර ආයතන වල මූළුතැන්ගෙය, කාණු පද්ධති, නාන ස්ථාන , වැසිකිලි, මල අපවහණ පද්ධති ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම සිදු කරනු ලබයි.2022 වසර තුළ වෙන් වූ රු.මි.100.0ක ප්‍රතිපාදන උපයෝජනය කර බන්ධනාගාර ආයතනයන්හි පැවති වැසිකිලි 291ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති අතර නව වැසිකිලි 46 ඉදිකිරීමටද කටයුතු කර ඇත. ආබාධිත නේවාසිකයින් සඳහා නව ආබාධිත වැසිකිලි 36ක් ද මේ යටතේ බන්ධනාගාර ආයතන වල ඉදිකර ඇත.	2024 වසර සඳහා වෙන්වූ රු.මි.400.0ක ප්‍රතිපාදන සීමාව තුළ බූස්ස, අහුණකොළපැලැස්ස මල අපවහන පද්ධති අළුත්වැඩියා කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු සිදු කර ඇත. බෝගම්බර බන්ධනාගාරයට අදාළ මල අපවහන පද්ධති අළුත්වැඩියා කටයුතු සඳහා වන ඇස්තමේන්තුව ලැබී එම මුදල් ජාතික ජල සම්පාදන හා ජල අපවහන මණ්ඩලය වෙත ලබා දීමට කටයුතු සිදුකර ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
		තවද වාවිටු තීන්ත ආලේපනය හා පිලිසකර කිරීම් අළුත්වැඩියා වැය විෂය හා ICRC වැනි ආයතන හා ඒකාබද්ධවද සිදුකරන ලදී. එමෙන්ම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (බන්ධනාගාර සෞඛ්‍ය) තනතුර සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වෛද්‍ය නිලධාරියකු පත් කර ඇත. මීට අමතරව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 07ක් සේවයේ නිරතව ඇත. ඔවුන් රැඳවියන්ගේ සනීපාරක්ෂක කටයුතු හා සෞඛ්‍ය කටයුතු සම්බන්ධව සොයාබැලීම් හා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලබයි.	බන්ධනාගාර ආයතන මට්ටමින් වන වැසිකිලි අළුත්වැඩියා හා අනෙකුත් ඉදිකිරීම් කටයුතු සිදු කරන අතර වාරියපොල, මීගමුව , කුරුවිට හා පොලෙන්නරුව බන්ධනාගාරයන්හි මල අපවහන පද්ධති ඉදිකිරීම සඳහා වන සැලසුම් හා නිර්මාණ කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජල අපවහන මණ්ඩලය කේෂ්ත්‍ර පරීක්ෂාවන් සිදුකර ඇස්තමේන්තු ලබා දී ඇත. ඊට අදාළ අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මැස්සන්, මකුණන් , මදුරුවන් හා මීයන් පාලනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වරින්වර සියළුම බන්ධනාගාර ආයතන මට්ටමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාවට නැංවීම.
9.22	වසර 34 කට වඩා පැරණි චක්‍රලේඛයක රේටයන් පදනම් කරගෙන ගෙවනු ලබන සිර වේතන වර්තමානයට ගැලපෙන ආකාරයට වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගැනීම තුළින් සාධාරණ වේතනයක් ගෙවීමට කටයුතු කිරීම හා නිදහස්ව යන සිරකරුවන්ට යහපත් පුරවැසියන් ලෙස සමාජයේ ජීවත්වීමට වඩා වැඩි අවස්ථාවක් ලබාදීමට කටයුතු කිරීම. (යොමුව 8.15.2 ඡේදය)	කර්මාන්ත සඳහා යොදවනු ලබන සිරකරුවන් සඳහා 1982 නොවැම්බර් 15 දිනැති 64/82 චක්‍රලේඛයට අනුව දැනට සිර වේතන ගෙවනු ලබන්නේ පහත පරිදිය • 1 වන ශ්‍රේණිය සඳහා - රු.1.00 • 2වන ශ්‍රේණිය සඳහා - රු.1.50 • 3වන ශ්‍රේණිය සඳහා - රු.2.00 • 4වන ශ්‍රේණිය සඳහා - රු.2.50 බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්ම තුළ හඳුනාගෙන ඇති පරිදි හා මෙම සිර වේතන වසර 40 කට වැඩි කාලයක් කාලානුරූපියව වැඩි වීමක් සිදු කර නොමැති බැවින් ඊට අවශ්‍ය කරුණු අධ්‍යනය කර නිර්දේශ ලබා දීම සඳහා පත් කරනු ලැබූ කමිටුව විසින් පහත පරිදි සිර වේතන ගෙවීමට නිර්දේශ ලබා දී ඇත. • 1 වන ශ්‍රේණිය සඳහා - රු.10.00 • 2වන ශ්‍රේණිය සඳහා - රු.15.00 • 3වන ශ්‍රේණිය සඳහා - රු.20.00 • 4වන ශ්‍රේණිය සඳහා - රු.25.00	ඒ අනුව බන්ධනාගාර රැඳවියකු සඳහා රජය විසින් විශාල මුදලක් වැය කරන බැවින් මෙම නිර්දේශය මෙම අවස්ථාවේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නොවන බව අමාත්‍යාංශ ලේකම් විසින් අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදී උපදෙස් ලබා දී ඇති බැව් අංක : SMPRPR/PRI/07/රාජ්‍ය ගිණුම්.කාර.සභා.වාර්තා හා 12.09.2023 දිනැති ලිපිය මගින්ද දැනුවත් කර ඇති බැවින් මෙම නිර්දේශය ක්‍රියාත්මක නොකෙරේ.
9.23	සිරෙන් නිදහස්ව සමාජගත කරනු ලබන සිරකරුවන්ගේ ජීවන පැවැත්ම පිළිබඳ තොරතුරු මෙන්ම නැවත සිරගත වන ප්‍රමාණය, වරදේ ස්වභාවය, සිරගත වන කාලය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම . (යොමුව 8.16.1 ඡේදය)	නිදහස්ව ගිය සිරකරුවන්ගේ ජීවන පැවැත්ම හා බැඳුනු තොරතුරු එක් රැස් කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත බැඳීමක් නොපවතින බැවින් දැනට එම තොරතුරු එක් රැස් කිරීමක් සිදු නොවේ. නැවත සිරගත වන ප්‍රමාණය, සිර ගත කාලය හා වරදේ ස්වභාවය වැනි තොරතුරු බන්ධනාගාර ආයතන මට්ටමින් එක් රැස් කර සංඛ්‍යාලේඛණ අංශය මගින් තොරතුරු විශ්ලේෂණය කර වාර්ෂිකව සංඛ්‍යාලේඛණ වාර්තාවේ පලකරනු ලබයි.	රැඳවි තොරතුරු පද්ධතියට ජීවමිතික දත්ත පද්ධතියක් සකසා ඒකාබද්ධ කිරීමට අදාළව සිදු කරන ලද කාර්යන්හි ප්‍රගතිය හා ඉදිරි සැලසුම් පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 95 හි අනු අංක- 09 යටතේ දක්වා ඇත.
9.24	දිර්ඝ කාලීන දඬුවම් ලද සිරකරුවනගේ දඬුවම් කාලය ලිහිල් කිරීම සඳහා පවතින ක්‍රමවේදයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.16.2ඡේදය)	1.දිර්ඝ කාලීන සිර දඬුවම් විඳින සිර කරුවන් සඳහා විශේෂ සමාව ප්‍රදානය කිරීම සඳහා සලකා බැලීමට වන නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටු පත් කර ඇත. මෙම කමිටුව අමාත්‍යාංශය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කල යුතුය. <u>දිර්ඝ කාලීන සිරකරුවන් -</u> ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති ගණන -154	1 මෙම යාන්ත්‍රණයේ පවතින අඩුපාඩු හඳුනාගෙන සුදුසු කමිටුවක් පත්කර මේ සම්බන්ධ ඉදිරි කටයුතු කිරීම.
9.25	නිලධාරි පුරප්පාඩු සම්පූර්ණ කර බන්ධනාගාර ආයතනවල දෛනික රාජකාරි කටයුතු බාධාවකින් තොරව සිදුකිරීමට අවශ්‍ය පරිසරය සැකසීම හා විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් බන්ධනාගාර නිලධාරින් දිරි ගැන්වීම හා පුහුණු කිරීම සහ බන්ධනාගාර සේවාවට සුවිශේෂී වූ නව සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම (යොමුව 8.17.1 ඡේදය)	1 බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුල පුරප්පාඩුව පැවති තනතුරු කිහිපයක පුරප්පාඩු පිරවීමට පසුගිය වසර කිහිපය තුළ කටයුතු කරනු ලැබීය. ඒ යටතේ භදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය – 194 බන්ධනාගාර නියාමක - 788 ජේලර් - 72 පුනරුත්ථාපන නිලධාරී -14	1 මීට අදාළ ප්‍රගතිය පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 95 අනු අංක 03 කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම යටතේ දක්වා ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
		2 පහත පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවතින කමිටු අනුමැතිය ලබා ගෙන ඇත. බන්ධනාගාර නියාමක -347 භෙද නිලධාරී - 38 වෘත්තීය උපදේශක (111 ශ්‍රේණිය) -69 ඖෂධ සංයෝජක - 27 කෘෂි ඕවසියර් -28 රියදුරු -22	
		<u>බන්ධනාගාර **නියාමක.**</u> මගේ අංක :MOJ/E008/RECR.CRU/PROCESS හා 2023.01.04 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇති පරිදි බන්ධනාගාර නියාමක (පිරිමි -300,කාන්තා 47) ලෙස බන්ධනාගාර නියාමක 347 බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය විභාග දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත. පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවයේ හා අර්ධ රාජ්‍ය සේවයේ නිරත පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා සකස්කළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. භෙද නිලධාරී ඖෂධ සංයෝජක වෘත්තීය උපදේශක කෘෂිකර්ම ඕවර්සියර්	
		3 බන්ධනාගාර සේවාව “විශෝධන සේවාව” ලෙස නම් කරමින් නව සේවා ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට කටයුතු කර ඇත. එය අනුමැතිය සඳහා මෙම අමාත්‍යාංශය වෙත යොමුකල පසුව එහි ඇතැම් කරුණු නැවත සමාලෝචනය කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නැවත යොමුකර ඇත. ඊට අදාළ සමාලෝචනයන් සිදුකිරීමට කමිටුවත් පත් කර ඇත.	බන්ධනාගාර සේවාව “විශෝධන සේවාව” ලෙස නම් කර කෙටුම්පත් කරන ලද සේවා ව්‍යවස්ථාවේ නැවත සමාලෝචනයට මෙම අමාත්‍යාංශය විසින් උපදෙස් ලබාදී ඇත. ඒ අනුව, පත්කරන ලද කමිටුව අදාළ සමාලෝචනයන් සිදුකරමින් පවතී.
9.26	බන්ධනාගාර නිලධාරීන් දිරි ගැන්වීම සඳහා වෙනත් ආකාරවලින් මුදල් ඉපයීම අවම කිරීම සඳහා රාජකාරී ස්වාභාවය හා නිවාඩු මත පදනම්ව ගෙවනු ලබන දීමනා වෙනුවට කාර්යක්ෂමතාවය හා දෙපාර්තමේන්තුවට එකතු කරනු ලබන වටිනාකම (Value added) මත පදනම්ව ගෙවනු ලබන දිරි දීමනා ක්‍රමයක් හඳුන්වාදීම හා අනුමත කර ගැනීම (යොමුව 8.17.2 ජේදය)	1 බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මූලික වැටුපෙන් 40%ක දීමනාවක් ලබා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යතුමන් විසින් 2020.12.22 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද අතර ඊට අදාළව ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ ඉදිරිපත් කරන ලෙසට 2021.01.18 දින තීරණය කර එම කොමිසමට යොමු කර ඇත. ඊට අදාළ වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා වන සාකච්ඡාවක් 2021.02.22 දින 2 පවත්වා ඇති අතර වැඩි දුර අධ්‍යනය කිරීම සඳහා මසක කාලයක් ජාතික වැටුප් කොමිෂන් සභාව ඉල්ලා තිබිණි. තවද, බන්ධනාගාර නිලධාරීන් සඳහා ලබා දෙන අනෙකුත් දීමනාද (යහපත් හැසිරීමේ 3 දීමනාව, අවදානම් දීමනා, සෞඛ්‍ය දීමනා යනාදී) කාලානුරූපියව වැඩි විය යුතු බැවින්, ඒ සඳහා වන ඉල්ලීම් අධ්‍යනය කර වාර්තා කිරීමට කමිටුවක් පත් කර ඇත.	1.මීට අදාළව සිදුකරන ලද ක්‍රියා මාර්ගයන්හි ප්‍රගතිය පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 95 හි අනු අංක- 13 යටතේ දක්වා ඇත.

අංකය	නිර්දේශය	නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ 2024.08.31 වන දිනට ප්‍රගතිය	ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වැඩපිළිවෙල/ යෝජනා
9.27	ගරාවැටුන නිල නිවාස අළුත්වැඩියාව ,අඩුපහසුකම් සහිත හා ඉතා පැරණි ආම්පන්න සහිත අනාරක්ෂිත කාර්යාල පරිශ්‍රවල ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීම ,අඩු පහසුකම් හා මකුණන් බෝ වී ඇති නිලධාරි බැරැක්ක වල ගැටළු විසඳීම තුළින්, නිලධාරින්ගේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට කටයුතු කිරීම (යොමුව 8.17.3 ඡේදය)	2023 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදන සීමාව තුළ කොළඹ බන්ධනාගාර සංකීර්ණයේ ගරාවැටුනු නිල නිවාස එක් පද්ධතියක් පිලිසකර කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. ඉදිරියේදී අනෙකුත් නිල නිවාසද ප්‍රමුඛතාව අනුව නිල නිවැසියන් තාවකාලිකව එම ස්ථාන වලින් ඉවත් කරමින් මෙම කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අපේක්ෂිතය.	2023/2024 වසර සඳහා වෙන්වූ ප්‍රතිපාදන සීමාව තුළ කොළඹ බන්ධනාගාර සංකීර්ණයට අයත් 63/1- 63/8 දක්වා වන නිල නිවාස අළුත්වැඩියා කර අවසන් කර ඇති අතර SPEAT Forec සඳහා නව බැරැක්කයක් ඉදි කර අවසන් කර ඇත. එමෙන්ම පල්ලන්සේන, මීගමුව හා බූස්ස යන ආයතනයන්හි නිල නිවාස හා බැරැක්ක පහසුකම් ඇති කිරීම සඳහා 2025 අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන ඉලසා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත.
9.28	සිරකරුවන්ට සැලකීමේ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතින් සමඟ සැසඳමේදී ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල තත්ත්වය ඉතා අඩු මට්ටමක පවතින බැවින් හැකි තරම් එම ප්‍රමිතීන්ට ලභාවීමට උත්සහ කිරීමෙන් එම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම. (යොමුව 8.2, 8.3,8.8, 8.10, 8.13, 8.15 ඡේද)	මේ සම්බන්ධව බන්ධනාගාර අධිකාරින්, ප්‍රධාන ජේලර්වරුන් ඇතුළු අනෙකුත් නිලධාරින් දැනුවත් කිරීමට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩ මුළු ICRC ආයතනය සමඟ එක්ව ද්නුවත් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම, ICRC ආයතනය හා එක්ව ජාත්‍යාන්තර නිර්දේශ, දේශීය නීති රාමුව කැටිකොට ශ්‍රී ලංකා බන්ධනාගාර සඳහා වන මාර්ගෝපදේශ ඇතුලත් Prison Brief වාර්තාව සැකසීමේ අවසන් අදියරේ කටයුතු සිදුකිරීම . සිරකරුවන්ට සැලකීමේ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් කරා ලභා වීමට හැකිවන පරිදි හා එම ප්‍රමිතීන් ආරක්ෂා කල යුතු අන්දම පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම් සිදු කර ඇත. එමෙන්ම නව ඉදිකිරීම් සියල්ල සැලසුම් කිරීමේදී අන්තර්ජාතිකව පිලිගත් නිර්ණායකයන්ට අනුකූලව ප්‍රමිතීන් ආරක්ෂාවන පරිදි නව ගොඩනැගිලි ඉදිකිරීමටත් කටයුතු කර ඇත.	සිරකරුවන් සඳහා අවම ප්‍රමිතීන් ලබා දීම පවත්නා යටිතල පහසුකම් මත ගැටළුකාරීවේ. මන්ද බොහොමයක් බන්ධනාගාර ආයතන පුළුල් කිරීමට තරම් භූමියේ වපසරියක් නොමැති වීම. එමෙන්ම සිරකරුවන් ප්‍රමාණයද දෛනිකව ඉහළ යන තත්වයක් පෙන්නුම් කරයි. මන්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වැඩි ප්‍රමාණයක් මේ අතර වන බැවින් එම වැරදිකරුවන් වෙනම රඳවා තැබීම සම්බන්ධ හැකියාව පිළිබඳ සාකච්ජාවක් මෙම අමාත්‍යාංශය සමඟ සිදුකල අතර මෙම තත්වය හමුවේ අවම ප්‍රමිතීන් සිරකරුවන්ට ලබා දීමේ හැකියාවක් බන්ධනාගාර පරිපාලනයට නොමැත. නව ඉදිකිරීම් සම්බන්ධ සැලසුම් හා නිර්මාණයේදී මේ ගැන සැලකීමට කටයුතු කර ඇති අතර මෙම ප්‍රමිතීන් පවත්වා ගැනීමට සඳහා සැලසුම් නිර්මාණයේදී වැදගත් වන ප්‍රකාශනයක්ද ICRC ආයතනයේ සහයෝගීතාව යටතේ මුද්‍රණය සඳහා කෙටුම්පත් කර ඇත.

පූර්ව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියෙහි වර්තමාන කාර්යසාධනය පිළිබඳ විස්තර කැඳවීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **95** - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු	කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ/ නියෝග	නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය
01. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ජනතාව දැනුවත් නොවීම	• ග්‍රාම නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මාර්ගයෙන් ජනතාව දැනුම්වත් කිරීම. • ආදර්ශ ණය සහන ඉල්ලුම් අයදුම්පත්‍රයක් සකස් කොට ලබා ගත හැකි ණය සහනයන් පිළිබඳව විස්තර සහ ශාඛා කාර්යාලවල දුරකථන අංක සහ අදාළ තොරතුරුද සහිතව උපදෙස් පත්‍රිකා ජනතාවට ලබා දීමට කටයුතු කරමින් ජනතාව මේ පිලිබඳව දැනුවත් කිරීමට නිසි ක්‍රමවේදයක් සැකසීම. • දැනට ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක නොවන දුෂ්කර පළාත්වල, රාජ්‍ය බැංකු/ මූල්‍ය ආයතනවලින් නොව අව්ධිමත් ආකාරයෙන් ණය ලබාගත් ණයකරුවන්ට ණය සහනදායක මණ්ඩලයෙන් ලබාගත හැකි සහන ලබා ගැනීමට ඉදිරිපත් කල යුතු අයදුම්පත සමග උපදෙස් පත්‍රිකාවක් ලබා දී පසුව ජංගම සේවා පැවැත්වීම. • දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ණය සහන අයදුම්පත් එකතු කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ඇතිව අදාළ ශාඛා කාර්යාලය වෙත යොමු කරන ක්‍රමයක් සකස් කිරීම.	• 2023/06/09 දින පැවති පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී දුන් නියෝගය අනුව 2023/06/27 දින දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සියළු දිසාපතිවරුන් වෙත ලිපි යැවූ අතර, ඒ අනුව ලද ආරාධනා මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. • ඊට අමතරව, මහජනයා දැනුවත් කිරීමට අදාලව අධිකරණ අමාත්‍යාංශයෙන් සහ වෙනත් රාජ්‍ය ආයතන මගින් පවත්වන ලද දීප ව්‍යාප්ත වැඩසටහන් සඳහා සහභාගී වී ඒ මගින් මහජනයා දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. • එසේම රූපවාහිනී වැඩසටහන්, පුවත්පත් සාකච්ඡා සහ ජංගම සේවා සඳහා සහභාගි වී දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා මහජනයා දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර, මේ වන විටත් එම කටයුතු සිදු කරමින් පවතී. (විස්තරය පහත දක්වා ඇත) දැනුවත් කිරීමේ වැඩසටහන් I. 2023.03.23 දින අධිකරණ අමාත්‍යාංශයේ ශ්‍රවනාගාරයේ දී පැවති මාධ්‍ය හමුව. II. 2023.07.08 දින කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. III. 2023.07.25 දින කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. IV. 2023.08.04 දින කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන් සහ දේශපාලන අධිකාරිය දැනුවත් කිරීම. V. 2023.08.07 දින තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. VI. 2023.09.14 දින පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. VII. 2023.09.16 දින කොළඹ දිස්ත්‍රික් ලේකම්කාර්යාලය - දිසාපති සමුළුව VIII. 2023.09.21 දින මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ප්‍රාදේශීය

		ලේකම්වරුන්, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. IX. 2023.09.22 දින අධිකරණ අමාත්‍යාංශය මගින් මහරගම ජාතික තරුණ සේවා සභා පරිශ්‍රයේ දී ජාත්‍යන්තර සාම දිනය සැමරීම වෙනුවෙන් පැවැත්වූ ජංගම වැඩසටහන සඳහා සහභාගී වීම. X. 2023.10.05 දින වැල්ලම්පිටිය බප/ජයවේරගොඩ විද්‍යාලයේ පැවති ජංගම වැඩසටහනේ දී ග්‍රාම නිලධාරීන්, ගුරුවරුන්, මහජනයා සහ රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කිරීම. XI. 2023.10.30 දින මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. XII. 2023.11.14 දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. XIII. 2024.04.25 දින මීගමුව නගර සභා ශාලාවේ දී කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද නීති අධාර වැඩමුළුව සඳහා සහභගී වීම. XIV. 2024.09.13 දින කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. <u>රූපවාහිනී වැඩසටහන්</u> I. 2023.07.17 දින පෙ.ව.07.00 ජාතික රූපවාහිනිය - අලුත්දිනක් වැඩසටහන II. 2023.07.28 දින පෙ.ව.07.30ස්වාධීනරූපවාහිනිය - පිනිවියන වැඩසටහන III. 2023.09.10පෙ.ව.11.30 TNL රූපවාහිනිය - ඔබගේ ගැටළු වැඩසටහන IV. 2024.07.24 දින පෙ.ව.9.00 - පෙ.ව.9.30 සියත රූපවාහිණිය - ආදරණීය ජීවිතයක් වැඩසටහන <u>පුවත්පත් සාකච්ඡා</u> I. 2023.04.30 - අරුණ පුවත්පත II. 2023.06.13 - දිනමිණ පුවත්පත III. 2024.09.15 - මොණරා පුවත්පත • ප්‍රාදේශීය කාර්යාල ආරම්භ කිරීමට සමගාමීව එකී දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීවරුන්ගේ කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙතම පෝස්ටර් බෙදා හරින ලද අතර එම පෝස්ටර් එනි ප්‍රදර්ශනය කර ඇත.

		• UNDP මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබා දීමට එකඟ වී ඇත. එම වැඩසටහන් සිදුකල යුතු ආකාරය අධ්‍යයනය කිරීම සඳහා සන්නිවේදන විශේෂඥයෙකු පත් කර ඇති අතර, ඒ පිළිබඳව අධ්‍යයන කටයුතු සිදු කරගෙන යනු ලබයි. • 2023.06.30 දිනැතිව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා ග්‍රාම නිලධාරින් දැනුවත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස දන්වා ලිපි යැවූ අතර, ඒ අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීය. I. 2023.08.04 දින කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය II. 2023.08.07 දින තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය III. 2023.10.30 දින මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එසේම 2024.08.16 දිනැතිව ශාඛා කාර්යාල ක්‍රියාත්මක වන දිස්ත්‍රික් 04හි පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 23 ක් වෙත සහ කළුතර ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය වෙත දැනුවත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා ලිපි යවා ඇත. ඒ අනුව ඉදිරියේදී පොලිස් අභ්‍යාසලාභීන් දැනුවත් කිරීමට නියමිතය. දින ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හිදී දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. එසේම, එම ලිපියට අනුව තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයකින් ජනාධිපතිවරණ ඡන්ද විමසීමෙන් පසු දැනුවත් කිරීමේ වැඩසහන් පැවැත්වීමට අවස්ථාව ලබා දී ඇත. I. 2024.09.13 දින කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ග්‍රාම නිලධාරීවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම. • ණය සහනදායක මණ්ඩලයේ අයදුම්පත්‍රය හා එය පිරවීම සඳහා වන උපදෙස් පත්‍රිකාව අන්තර්ජාලයට ඇතුලත් කර ඇති අතර, අප විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී හා ජංගම සේවාවලදී ශාඛා කාර්යාලවල දුරකථන අංක සහ අදාල තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා බෙදා හරිනු ලැබේ. • මේ වසරේ දී දුර පළාත්වල දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු අතර, 2025 වසරේ අයවැය ඇස්තමේන්තුවල එම කරුණු ඇතුළත් කර ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.

<table>
<tr>
<td></td>
<td></td>
<td>• ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු වන ගැටළු ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. ඒ අනුව එවැනි අයදුම්පත් අදාල ශාඛා කාර්යාල වෙත ලැබේ.</td>
</tr>
<tr>
<td>02. ප්‍රාදේශීයකාර්යාලපිහිටුවීමහාඅවශ්‍යසේවකසංඛ්‍යාව අනුමතකරගැනීම.</td>
<td>• දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ණය සහනදායක මණ්ඩලයේ ශාඛා පිහිටුවීමට කටයුතු කිරීම.

• ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේ ආරම්භක පියවරක් වශයෙන් ප්‍රථමයෙන් පළාත් 9 ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම. (දැනට ආරම්භ කර ඇති පළාත් 3ට අමතරව ඉතිරි පළාත් 6 සඳහා)

• ප්‍රාදේශීය වශයෙන් නව කාර්යාල ස්ථාපිත කිරීම පිළිබඳව සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් 2023 ජූලි මස 10 වැනි දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත කාරක සභාව නියෝග කළේය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක DCB/AC/37/11/2023 හා 2023.07.10 දිනැති ලිපිය මගින් අදාල වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.</td>
<td>• දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි කාර්යාල පිහිටුවීම සඳහා දැනුම් දී ඇතත්, මණ්ඩලය වෙත ඒ ඒ දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් වන අයදුම්පත් සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වෙන අතර සෑම දිස්ත්‍රික්කයකින්ම අයදුම්පත් ඉදිරිපත් නොවීම පිළිබඳව සලකා බලාශාඛා කාර්යාල 02ක් මධ්‍යම සහ සබරගමුව පළාත් කේන්ද්‍ර කරගනිමින් පිහිටුවීමට තීරණය කර ඇත.

<table>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>2024.07.31 දිනට දිස්ත්‍රික්ක අනුව ලද අයදුම්පත් සංඛ්‍යාව</td></tr>
<tr><td>කොළඹ</td><td>31</td></tr>
<tr><td>ගම්පහ</td><td>96</td></tr>
<tr><td>කළුතර</td><td>42</td></tr>
<tr><td>ගාල්ල</td><td>45</td></tr>
<tr><td>මාතර</td><td>24</td></tr>
<tr><td>කුරුණෑගල</td><td>40</td></tr>
<tr><td>කෑගල්ල</td><td>26</td></tr>
<tr><td>රත්නපුර</td><td>15</td></tr>
<tr><td>මහනුවර</td><td>17</td></tr>
<tr><td>මාතලේ</td><td>08</td></tr>
<tr><td>පුත්ලම</td><td>05</td></tr>
<tr><td>හම්බන්තොට</td><td>04</td></tr>
<tr><td>බදුල්ල</td><td>02</td></tr>
<tr><td>අම්පාර</td><td>02</td></tr>
<tr><td>අනුරාධපුර</td><td>02</td></tr>
<tr><td>මොණරාගල</td><td>01</td></tr>
<tr><td>එකතුව</td><td>360</td></tr>
</table>

• ඉහත ශාඛා කාර්යාල 02ක පිහිටුවීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් 2024</td>
</tr>
</table>

		වර්ෂයේඅයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කළ ද ප්‍රතිපාදන ලබාදීනොමැත. 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් මේ සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් කල අතර, පැවති අයවැය සාකච්ඡාවේදී අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙන බව පවසන ලදී. • එම ප්‍රතිපාදන ලද පසු නව ශාඛා කාර්යාල සඳහා අවශ්‍ය තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කරනු ලැබේ. • කෙසේ වෙතත් 2024.09.26 දින පැවති දෙපාර්තමේන්තු විගණන හා කළමණාකරණ කමිටුවේදී දැනට පවතින නඩු සංඛ්‍යාව අනුව (මධ්‍යම 58ක් හා සබරගමුව 58ක්) නව ශාඛා පිහිටුවීමට යන වියදම සලකා බැලීමේදී එය ඵලදායී නොවන බවත් ශක්‍යතා අධ්‍යනයක් කිරීමෙන් පසුව තීරණය කිරීම සුදුසු බවත් සාකච්ඡා විය. (පවතින නඩු සංඛ්‍යාව හා එම නඩු ශාඛා කාර්යාලවලට බෙදී යන ආකාරය ඇතුළත් විස්තරය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.)
03. විගණකාධිපතිවිසින්නිරීක්ෂණයකළදෙපාර්තමේන්තුවේදුර්වලතා	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සිදුකරනු ලබන මාර්ගගත ඇගයීම් ක්‍රියාවලියේදී ණය සහනදායක මණ්ඩලයීය දෙපාරත්මේන්තුවේ ලකුණු අඩු වීමට හේතු ප්‍රඥප්තිය සකස් නොකිරීම, ක්‍රියාකාරී සැලැස්ම සකස් නොකිරීම හා තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබීම යන කරුණු බලපා තිබූ බව	විගණකාධිපති නිරීක්ෂණය කළ දුර්වලතා මහඟරවා ගනිමින් මේ වන විට දෙපාර්තමේන්තුවේ සහ ශාඛා කාර්යාලවල ලිපි ගොනු ක්‍රමවත්ව පවත්වාගෙන යනු ලැබේ. පුරවැසි සේවා ප්‍රඥප්තිය සකස් කර ඇත. ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම හා ඒ අනුව කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.
04. ඉල්ලුම්පත්විසඳීමේප්‍රගතිය	දෙපාර්ශවය සමථකරණයට පත් කලද, මුදල් ගෙවා අවසන් වනතුරු අදාල ලිපිගොනුව වසා නොදැමීම නිසා ඒවා ද නොවිසඳුනු ඉල්ලුම්පත් ලෙස සැලකීමෙන් ඉතිරි වූ ඉල්ලුම්පත්වල වැඩිවීමක් පෙන්නුම් කරන බව (1) එම තත්වය මගහරවා ගැනීම සඳහා තොරතුරු ඇතුළත් කිරීමේදී ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව, විසඳුම් ලබා දුන් සංඛ්‍යාව, මුදල් ගෙවා අවසන් කල සංඛ්‍යාව සහ ඉතිරිව ඇති ඉල්ලුම්පත් සංඛ්‍යාව වශයෙන් කාණ්ඩවලට වෙන්කොට සටහන් පවත්වා ගන්නා ලෙස (11) ප්‍රාදේශීය වශයෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බැලීම සඳහා ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය කාරකසභාව අවධාරණය කලේය.	• 1941 අංක 39 දරණ ආඥා පනත අනුව දෙපාර්ශවය සමථයට පත් කිරීම ණය සහන මණ්ඩලයේ කර්තව්‍ය වුවත් සමථයකින් පසුවද මුදල් ගෙවා අවසන් වනතුරු අදාල ලිපි ගොනු වසා නොදැමීම නිසා කැඳවනු ලබන නඩු සංඛ්‍යාව ඉහල අගයක් ගනී. 2023 වර්ෂයේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 1811ක් වන අතර, නඩු 1101ක් විසඳා ඇත. ඒ අනුව කාර්ය සාධනය 60% ක අගයක් ගනී. • ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව, විසඳුම් ලබා දුන් සංඛ්‍යාව, මුදල් ගෙවා අවසන් කල සංඛ්‍යාව සහ ඉතිරිව ඇති ඉල්ලුම්පත් සංඛ්‍යාව වශයෙන් කාණ්ඩවලට වෙන්කොට සටහන් පවත්වා ගැනීම සිදු කරනු ලැබේ. ඒ අනුව අමාත්‍යාංශය වෙත මාසිකව වාර්තා එවීම සිදු කෙරේ. • ප්‍රධාන මණ්ඩලයට අමතරව දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේම

		කොළඹ ශාඛා කාර්යාලය සහ ඊට අමතරව ගම්පහ, ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික් කේන්ද්‍ර කර ගනිමින් ශාඛා කාර්යාල පවත්වා ගෙන යනු ලැබේ. මධ්‍යම සහ සබරගමුව පළාත් කේන්ද්‍ර කරගනිමින් ශාඛා කාර්යාල 02ක් ඉදිරියේදී පිහිටුවීමට සැලසුම් කර ඇත.
05. ණය සහනදායක මණ්ඩලයේ සාමාජිකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් නොකිරීම හා සංයුක්ත දීමනා ගෙවීම	• මේ සම්බන්ධයෙන් විගණන විමසුම් ඉදිරිපත් කරනු ලබන්නේ සංයුක්ත දීමනාවට හිමිකම් කීම සඳහා පැය 6ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු බවට පවතින නීතිමය ප්‍රතිපාදන මත පදනම්ව බව • මෙම ගැටළුව සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා සමග තවදුරටත් සාකච්ඡා කොට විසඳුමකට එලඹෙන ලෙස ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරීට කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී.	• මේ පිළිබඳව නියෝජ්‍ය විගණකාධිපති සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අදාළ විෂය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබා ගත යුතු බවට තීරණය විය. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
06. ණය සහනදායක මණ්ඩලයේ කාර්ය භාරය හා බලතල සම්බන්ධයෙන් පොලිසිය දැනුවත් නොවීම	• ණය සහනදායක මණ්ඩලයට යොමු කර ඇති ගැටලුවක් සම්බන්ධයෙන් දෙපාර්ශවයක් අතර ගැටුම් ඇති වූ අවස්ථාවන්හිදී පොලිස් නිලධාරීන් ක්‍රියා කරන ආකාරය අනුව පොලිසියටද ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පිලිබඳව අවබෝධයක් නොමැති බව • ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ද අධිකරණ කටයුත්තක් හා සමාන බවට පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස රජයේ ගිණුම් කාරක සභාව උපදෙස් ලබා දුන් බව පොලිස්පතිවරයා වෙත දන්වා යවන ලෙස කාරක සභාව අධිකරණ අමාත්‍යාශයේ ප්‍ර.ග.නි. ට උපදෙස් ලබා දුන්නේය.	පොලිස් නිලධාරීන්ගේ මේ සම්බන්ධව පවතින දැනුම මද බැවින් පුහුණුවන පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා 2024.08.16 දිනැතිව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ලිපියක් යවා ඇත. ඊට අමතරව එම ආයතනයේ අධ්‍යක්ෂක සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර එහිදී පොලිස් අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්යවරුන් හට එක් දින වැඩමුළුවක් මඟින් ණය සහන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුවත් කොට ඒ පිළිබඳව විෂය මාලාවට ඇතුළත් කිරීම මඟින් අලුතින් පොලිස් සේවයට බැඳෙන සෑම නිලධාරියෙකුටම ඒ පිළිබඳව දැනුවත්භාවයක් ලබාදීමට කටයුතු කිරීම වඩාත් සුදුසු බව සාකච්ඡා කරන ලදී.ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
07. කුලී ගිවිසුම් යාවත්කාලීන කිරීම හා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම	• ණය සහනදායක මණ්ඩලයේ ශාඛා කාර්යාල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලිවල කුලී ගිවිසුම් කල් ඉකුත්වී ඇති බැවින් ඒවා යාවත්කාලීන කිරීමට පියවර ගන්නා ලෙසත්, ආයතනයට අදාල තිරසර සංවර්ධන අරමුණු තවදුරටත් වැඩිදියුණු කර ගැනීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදී.	ශාඛා කාර්යාල පවත්වා ගෙනයනු ලබන කුලී ගොඩනැගිලිවල කුලී ගිවිසුම් යාවත් කාලීන කර ඇත. තිරසර සංවර්ධන අරමුණු වැඩි දියුණු කර ගනිමින් විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමයක් වශයෙන් වඩා ඵලදායී අයුරින් ගැටළු විසඳීම සඳහා කටයුතු කරනු ලැබේ.

දැනට පවතින ශාඛා මණ්ඩලවල නම්	එක් එක් ශාඛා මණ්ඩල සඳහා මේ වන විට පවතින නඩු සංඛ්‍යාව	ස්ථාපිත කිරීමට නියමිත රත්නපුර ශාඛාවලට ලබා දීමට බලාපොරොත්තු වන නඩු සංඛ්‍යාව	ස්ථාපිත කිරීමට නියමිත මහනුවර ශාඛාවට ලබා දීමට බලාපොරොත්තු වන නඩු සංඛ්‍යාව
ප්‍රධාන ශාඛාව 230 කොළඹ ශාඛාව 208	438	රත්නපුර දිස්ත්‍රික්කය - 22 කෑගල්ල දිස්ත්‍රික්කය - 36 මොණරාගල දිස්ත්‍රික්කය - 00	-
ගාල්ල ශාඛාව	106	-	-
ගම්පහ ශාඛාව	111	-	-
කුරුණෑගල ශාඛාව	236	-	මහනුවර දිස්ත්‍රික්කය - 45 මාතලේ දිස්ත්‍රික්කය - 11 නුවරඑළිය දිස්ත්‍රික්කය - 01 බදුල්ල දිස්ත්‍රික්කය - 01

ස්ථාපිත කිරීමට නියමිත ශාඛාවලට දැමූ පසු නඩු සංඛ්‍යාව බෙදී යන ආකාරය

දැනට පවතින ශාඛා මණ්ඩලවල නම්	එක් එක් ශාඛා මණ්ඩල සඳහා මේ වන විට පවතින නඩු බෙදී යන ආකාරය
ප්‍රධාන ශාඛාව හා කොළඹ ශාඛාව	380
ගාල්ල ශාඛාව	106
ගම්පහ ශාඛාව	111
කුරුණෑගල ශාඛාව	178
මහනුවර ශාඛාව (ස්ථාපිත කිරීමට නියමිතය)	58
රත්නපුර ශාඛාව (ස්ථාපිත කිරීමට නියමිතය)	58

පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියෙහි වර්තමාන කාර්යසාධනය පිළිබඳ විස්තර කැඳවීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 95 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	ගිණුම් කාරක සභාවේ නිරීක්ෂණ/නිර්දේශ/ නියෝග	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග
01	විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම		දෙපාර්තමේන්තුව විසින් 2023.06.09 දින රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග අනුව ඉන් ඉදිරියට විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ණ අධීක්ෂණය යටතේ පමණක් සිදු කෙරේ.
02	කාර්ය මණ්ඩල පුරප්පාඩු		• මේ වන විට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි තනතුරු 10ක් සඳහා ස්ථිර නිලධාරීන් පත්කර ඇත. • පරිපාලන නිලධාරි තනතුර සඳහා 2024.03.11 දින සිට නිලධාරියෙකු ස්ථිරව පත් කර ඇත. • පුරප්පාඩුව පැවති ප්‍රජා විශෝධන නිලධාරි තනතුරු 07 ක් සඳහා ද නිලධාරීන් පත් කරඇත.
03	සේවා ව්‍යවස්ථාවක් නොමැතිවීම		ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා සේවා ව්‍යවස්ථාවක් නොමැති වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත පටිපාටිය අනුව සියලු බඳවා ගැනීම් හා උසස්වීම් සිදු කරනු ලැබේ. දැනට පවතින බඳවා ගැනීමේ හා උසස්වීම් පටිපාටිවල ඇති ගැටලුවලට අදාළව සංශෝධන මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කිරීමට අදාළව නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව සකස් කරන ලෙස ලබා දුන් උපදෙස් අනුව ක්‍රියා කරනු ලැබේ.
04	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්		2023.06.09 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් සහ ක්‍රියාවලිය සම්බන්ධව කාරක සභාව දැනුවත් කරන ලදී. ඊට අමතරව ප්‍රජා විශෝධන නියෝගයක් ලබා දිය හැකි නමුත් බන්ධනාගාරගතව සිටින වරදකරුවන් සඳහා ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා දීමට අදාළව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් පවතී.
05	ආඥාලාභීන් ඔවුන්ගේ නිවෙස්වල සිටිය දීම විශෝධනය කිරීම	ප්‍රජාවිශෝධන නිලධාරීන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් පමණක් විශෝධන කාර්යය සාර්ථක නොවන බව කාරක සභාව ප්‍රකාශ කළේය. ඒ සඳහා විශේෂඥ දැනුම ඇතිඋපදේශකයින්, ආගමික නායකයින්, මනෝ වෛද්‍ය උපදේශකවරුන් වැනි පාර්ශවයන් ද සම්බන්ධකර ගනිමින් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව කාරක සභාව පෙන්වා දුන්නේය.විශෝධනය කිරීමෙන් අනතුරුව සමාජගත කරන පුද්ගලයින් පිළිබඳ පසු විපරමක් අවශ්‍ය බව ද කාරක සභාව අවධාරණය කළේය. දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණයක් සහ පසුවිපරමක් අවශ්‍ය බැවින් ඒ සඳහා උපදේශක මණ්ඩලයක් සහ මෙහෙයුම් කමිටුවක් පත් කොට විශෝධන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා උපදේශක මණ්ඩලයක් සහ මෙහෙයුම්කමිටුවක් පත්කොට, විශෝධන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කොට 2023 ජූලි 10වැනි දිනට පෙර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන	දෙපාර්තමේන්තු කටයුතු තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක් හා උපදේශන මණ්ඩලයක් පත් කරන ලෙස කාරක සභාව දැනුම්දුන් අතර ඒ අනුව උපදේශන මණ්ඩලය පිහිටුවීම සඳහා කැබිනට් අනුමැතිය ලැබුණු අතර පළමු රැස්වීම පවත්වා ඇත. තවද කාරක සභාවේ අදහස අනුව, දෙපාර්තමේන්තුවේ විශෝධන ක්‍රියාවලිය වඩා ඵලදායී ප්‍රගතියක් කරා රැගෙන ඒම සඳහා මත්ද්‍රව්‍ය හා මත්පැන් ආශ්‍රිත වරදකරුවන්ගෙන් උග්‍ර ඇබ්බැහිකාරී තත්වයකට පත්ව විරමණ ලක්ෂණ පෙන්නුම් කරන වරදකරුවන් වෙන් කොට හඳුනා ගෙන මූලික ප්‍රතිහරණ ක්‍රියාවලියකට අදාළව ප්‍රතිකාර හා විශෝධන මධ්‍යස්ථාන වෙත කෙටිකාලීන යොමු කළ යුතුව ඇති බැවින් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව යටතේ විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට කැකිරාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අක්කර 06ක වපසරියකින් යුත් ඉඩම් කොටසක් වෙන් කොට ගෙන මැනුම් කටයුතු අවසන් කර ඇත. තවද මෙම අමාත්‍යාංශයේ උපදෙස් මත සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී.

		ලෙසඅධිකරණ බන්ධනාගාර කටයුතු ආණුඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය. අධිකරණ බන්ධනාගාර කටයුතු ආණුඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOJ/AC/37/11/2023 හා 2023.07.10 දිනැති ලිපිය මඟින් අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් උපදේශක මණ්ඩලයක් පිහිටුවීමටත්, උපදේශක මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මූලිකත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කිරීමට කටයුතු කරන බවත් උක්ත වාර්තාවේ සඳහන් වේ.	
06	විශෝධන ක්‍රියාවලිය නිසිපරිදි සිදු නොවීම හා ඒ පිළිබඳව සමාජයේ දැනුවත්භාවය අඩුවීම.	• මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා, මහජන සබඳතාවය හා සන්නිවේදන කුසලතාවය සංවර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම යන ක්‍රියාකාරකම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණ ද, මෙම ක්‍රියාකාරකම් සිදු කර නොතිබුණු බව. • විශෝධන ක්‍රියාවලිය නියමානුකූලව සිදු වන්නේ නම් සුළු වැරදිකරුවන් විශෝධනය සඳහා යොමු කිරීමට මහේස්ත්‍රාත්වරුන් පෙළඹෙන බව. • එය බන්ධනාගාර තදබදය අවම කිරීම සම්බන්ධයෙන් වැදගත් සාධකයක් බව.	2023 වර්ෂයේදී මහේස්ත්‍රාත් අධිකරණ විසින් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙත සුළු වරදකරුවන් 14,066 දෙනෙකු විශෝධනය සඳහා යොමු කරන ලදි. 2024.07.31 වන විට වරදකරුවන් 10,138ක සංඛ්‍යාවක් යොමු කර ඇත. 2023 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට දෙපාර්තමේන්තුව ක්‍රියා කළ අතර2024 ක්‍රියාකාරී සැලැස්මට අනුව මත් නිවාරණ වැඩසටහන්, පුහුණු වැඩසටහන් ඇතුළු අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකරමින් පවතී. ඒ අනුව, ප්‍රජා විශෝධන ක්‍රියාවලිය පිළිබඳව නිලධාරීන් හා මහජනතාව දැනුවත් කිරීම සඳහා 2023 වර්ෂයේදී • රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) - 165 • අධිකරණ නිලධාරීන් හා නීතිවරුන් දැනුවත් කිරීම - 72 • පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම - 54 • ප්‍රජා දැනුවත් කිරීම් (ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි) - 1465 • ප්‍රජා දැනුවත් කිරීම් (විශේෂ වැඩසටහන්) – 492 2024 .07.31 දින වන විට • රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) - 126 • අධිකරණ නිලධාරීන් හා නීතිවරුන් දැනුවත් කිරීම -59 • පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම - 29 • ප්‍රජා දැනුවත් කිරීම් (ග්‍රාම නිලධාරී වසම් ආවරණය පරිදි) - 734 • ප්‍රජා දැනුවත් කිරීම් (විශේෂ වැඩසටහන්) – 364 ආදී වශයෙන් වැඩසටහන් සිදුකර ඇත.

ආචාර්ය හරිනි අමරසූරිය (හා.ම.)

අග්‍රාමාත්‍ය සහ අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය

2024-10-03

ආචාර්ය හරිනි අමරසූරිය
ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
අග්‍රාමාත්‍ය කාර්යාලය
අංක 58, ශ්‍රීමත් ඒ්‍රසන්ට් ද සිල්වා මාවත
කොළඹ 07